මේ අපේ රට නිසා
අපට සිහිනයක් ඇත
WE HAVE A DREAM

# විකල්පයක් නැත...!

## ආර්ථික අර්බුදය සහ විසඳුම් ගැන විමසුමක්

සී.ජේ. අමරතුංග

# විකල්පයක් නැත...!

## ආර්ථික අර්බුදය සහ විසඳුම් ගැන විමසුමක්

# විකල්පයක් නැත...!

## ආර්ථික අර්බුදය සහ විසඳුම් ගැන විමසුමක්

**සී.ජේ. අමරතුංග**

මේ අපේ රට නිසා
අපට සිහිනයක් ඇත
WE HAVE A DREAM

# විකල්පයක් නැත...!

## ආර්ථික අර්බුදය සහ විසඳුම් ගැන විමසුමක්

© සී.ජේ. අමරතුංග

2024 මාර්තු 31

ISBN 978-624-5860-06-7

පිටු සැකසුම හා මුද්‍රණය

**adARTS**
මහරගම

ප්‍රකාශනය

**We Have a Dream සාමූහිකය**
56/2, පාලිත පෙදෙස, කොළඹ 9.

අප හමුවේ මේ මොහොතෙහි තිබෙන අභියෝගය වන්නේ 2024 මැතිවරණ වර්ෂයේ ජනප්‍රියවාදී දේශපාලනය හේතුවෙන් දැනට ක්‍රියාත්මක ආර්ථික ප්‍රතිසාධන වැඩසටහනෙහි පීලි පනියි ද යන්නයි. එසේ වුවහොත්, යළි අසීරුවෙන් පීල්ලට දමාගත් ආර්ථික දුම්රියෙහි ගමන ලත් තැනම ලොප් වනු ඇත.

ජනප්‍රියවාදී සටන් පාඨ හා සුරංගනා කතා දැන් දැන් දේශපාලන වේදිකාවල වැඩි වැඩියෙන් අසන්නට ලැබේ. මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරවලදී සුරංගනා කතා කීම ලාංකිකයන්ට අලුත් දෙයක් නොවන අතර මහජනතාව ඒ සුරංගනා කතා එතරම් විශ්වාස කරන්නේ ද නැත. එහෙත්, සුරංගනා කතා කියන ඇතැම් නායකයන් තමන්ගේ ම බොරුවලට රැවටී කටයුතු කිරීම හේතුවෙන් ඇති වූ හානි පිළිබඳ උදාහරණ ඇත්තේ එකක් දෙකක් නොවේ.

මෙම පසුබිම තුළ, ආර්ථික හා සමාජ සංවර්ධනය ගැන සිවිල් සමාජයේ අවබෝධය වැඩිදියුණු කරගැනීම ද, ඒ පිළිබඳ මහජනයා දැනුම්වත් කිරීම හා පාලකයන් හා නායකයන් සමඟ තිරසර ප්‍රතිපත්ති වෙනුවෙන් උද්දේශනය ද අපගේ අරමුණයි. මෙම කෘතිය සම්පාදනය කරනු ලැබුවේ ඒ වෙනුවෙනි.

**We Have a Dream සාමූහිකය**

# පෙරවදන

රටේ ආර්ථිකය බිඳ වැටී තිබුණු මොහොතක රට ගොඩ ගැනීමේ වගකීම භාරගත් රනිල් වික්‍රමසිංහ මහතා තමාට තිබෙන අවදානම් ගමන ගැන කීමට යොදාගත් උදාහරණය කාටත් මතක හිටින කතාවකි. ඔහු එය උපමා කළේ හුණුවටයේ කතාවේ ග්‍රෑෂාගේ වැල් පාලමේ ගමනට ය. එය සැබවින් ම, හොඳින් තේරෙන පැහැදිලි කිරීමකි.

මේ පොතෙහි කතා කරන්නේ දැනට රටේ ක්‍රියාත්මක කරමින් තිබෙන ආර්ථික වැඩ සටහන පිළිබඳව ය. එහි දී ද අපට ගැළපෙන ම අදහස ලැබෙන්නේ හුණුවටයේ කතාවේ ග්‍රෑෂාගේ වැල් පාලමේ ගීතයෙනි. එහි ඇය කියන්නේ "අපට පුතේ මගක් නැතේ - මේ මග මිස - යමන් පුතේ" කියා ය. මේ මග හැර අපට වෙනත් මගක් නැත. ඒ බව බොහෝ දෙනා දනිති. නමුත් සමහරු වෙනත් මාවත් සොයති.

තමන්ට විකල්ප විසඳුම් ඇති බව සමහරු කියති. එසේ කියන විපක්ෂයේ පක්ෂ පසුගිය දා මෙරටට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත කණ්ඩායම ද හමුවූහ. ඒ ගැන මූල්‍ය අරමුදලේ මෙරට නේවාසික නියෝජිත පීටර් බ්‍රෑවර් මහතා ප්‍රකාශ කළේ "විකල්ප අදහස්වලට සවන්දෙන්න අපි කැමතියි. නමුත් ශ්‍රී ලංකාවට තිබෙන්නේ කඩු තුඩු මත ගමනක්" යනුවෙනි. ඒ මහතා කීවේ යන්තම් ලිස්සා වැටුනොත් නැවත වඩා බරපතළ අර්බුදයකට රට ඇද වැටිය හැකි බව යි.

මෙහි තේරුම අපගේ අවදානම් ගමන තවමත් අවසන් වී නැති බව යි.

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රශ්න පිළිබඳ ඉතා වැදගත් විග්‍රහ ඉදිරිපත් කරන විද්වතෙක් වන මහාචාර්ය විදුර තෙන්නකෝන් මහතා ලියූ ලිපියක කියා තිබුණේ ශ්‍රී ලංකාවට ආර්ථික අර්බුදයෙන් ගොඩ යාමට ඇත්තේ මේ මාවත බව බොහෝ දෙනා දැන සිටියත් ඒ වෙනුවෙන් පෙනී සිටින්නට ඉදිරිපත් වී ඇත්තේ ඉතා සුළු පිරිසක් බව යි.

එලෙස අර්බුදයෙන් ගොඩ යන්නට මේ මග හැර වෙන මගක් නැති බව බොහෝ දෙනා දැන සිටියත් එම මග ආරක්ෂා කරන්නට ඉදිරිපත් නොවීම

නිසා කුමන මොහොතක හෝ මේ මාර්ගයෙන් ලිස්සා වැටීමට තිබෙන අවදානම වැඩි ය. එය භයානක තත්ත්වයකි. අපට ඇති එක ම මග මෙය බව තේරුම් ගෙන එය ආරක්ෂා කිරීමට ඉදිරිපත්ව සිටින සුළු පිරිස අතරින් ද සුළු පිරිසක් 'අපට සිහිනයක් තිබේ' නමින් එකතුවක් ලෙස ක්‍රියා කරති. රටේ විවිධ ප්‍රදේශවල මෙම සංවිධානය විසින් සිදු කරන ලද සාකච්ඡා සම්මන්ත්‍රණවල අත්දැකීම් අනුව තීරණය වුයේ මෙම අදහස් විධිමත් ලෙස ඉදිරිපත් කෙරෙන ලිපි සහ පොත් පිංච කිහිපයක් අවශ්‍ය බව යි. මෙම පොත් පිංච ලියවෙන්නේ ද එම කාර්යයට දායක වීම සඳහා ය.

හදිසියෙන් යමක් අවශ්‍යව තිබූ නිසා මෙය ලියවෙන්නේ ද හදිසියෙනි. වැඩි වශයෙන් දත්ත ඉදිරිපත් කිරීමට මෙහි දී උත්සහ දරා නැත. මෙහි කියන කරුණු පිළිබඳව සැකයක් ඇත්නම් බොහෝ විට අන්තර්ජාලයෙන් පහසුවෙන් එම දත්ත සොයාගත හැකි වනු ඇත.

බොහෝ දේ කෙටියෙන් ඉදිරිපත් කළ ද, අවශ්‍ය කරුණ ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහ දැරුවෙමි. අවශ්‍ය වුවහොත් පසුව වෙනත් ලිපි මගින් ඇතැම් කරුණු විස්තර කිරීමට බලාපොරොත්තු වෙමි. අපට ඇති එක ම මග මෙය වන්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට සහ එහි දී මුහුණ දෙන අභියෝග පෙන්වා දීමට මෙමගින් උත්සාහ දරා ඇත.

ගංවතුර කාලයට නයාත් මුගටියාත් එක කොටයේ යන බවට කියමනක් ඇත. අද අප මුහුණ දී සිටින්නේ ද එබඳු කාලයකට ය. සමහරු එය තේරුම් ගෙන සිටිති. තවත් සමහරු එය හොඳින් තේරුම් ගෙන ඇති නමුත් නොතේරුනා සේ සිටිති.

ගංවතුරට එක කොටේ ගියත් නයා මුගටියා වන්නේවත්, මුගටියා නයා වන්නේවත් නැත. නමුත්, දෙදෙනාට තමන්ගේ පුරුදු ජීවන චර්යාවට යන්න ලැබෙන්නේ ගංවතුරෙන් නිරුපද්‍රිතව එගොඩ වුවහොත් පමණකි. කොටයේ සමතුලිතතාව බිඳ ගතහොත් නයාත්, මුගටියාත් දෙදෙනාම අනතුරේ ය.

අද අප මුහුණ දී තිබෙන්නේ ද එබඳු තත්ත්වයකට ය. එය තේරුම් ගෙන කටයුතු කිරීම සියලු දෙනාගේ යහපත පිණිස වනු ඇත.

මෙම ලියැවිල්ල ද එයට පිටිවහලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**සී. ජේ. අමරතුංග**
2024 මාර්තු 31

# පටුන

පරිච්ඡේදය 1

**ආර්ථික බිඳවැටීමක් දක්වා ගිය අර්බුදය** 1

අර්බුදයට හේතු ගැන කියන කතා 2

උගුලක් වූ ණය ගැනීම් 3

ඉහවහාගිය දූෂණය සහ එහි ආර්ථික බලපෑම 5

දූෂණයේ විනාශයේ වැරදි තැනින් ඇල්ලීම 7

දූෂිත දේශපාලන ක්‍රමයේ අතුරු ප්‍රශ්න 9

ආර්ථිකයට දැරිය නොහැකි රාජ්‍ය සේවය 11

රාජ්‍ය ආයතන 12

බදු අඩු කිරීම 12

කොරෝනා වසංගතය මහ ව්‍යසනයක් කර ගැනීම 12

තදියම් කාබනික වගාවේ විනාශය 13

මුදල් නෝට්ටු මුද්‍රණය 13

රුපියල රැක ගැනීමට ඩොලර් නාස්ති කිරීම 14

ආර්ථික කඩාවැටීමේ පාඩම 15

පරිච්ඡේදය 2

**ආර්ථික අර්බුදයේ සංයුක්ත කොටස් දෙක සහ විසඳුම්** 17

ද්විත්ව හිඟයයන් 18

ප්‍රාථමික ගිණුම 18

ජංගම ගිණුමේ හිඟය හෙවත් ගෙවුම් ශේෂ ප්‍රශ්නය 20

ණය, සංවර්ධනයේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස 23

ආර්ථික අර්බුදයේ අද අප කොතන ද? 25

ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් 26

ජංගම ගිණුමේ ප්‍රශ්නයට විසඳුම් 26

ණය ප්‍රතිව්‍යුහගත කරණය 27

පරිච්ඡේදය 3

**අර්බුදයෙන් මිදීමේ අභියෝගය** 31

රජයේ වියදම් කළමනාකරණය 31

විදේශ විනිමය අර්බුදයේ අභියෝගය 36

වෙළඳ ගිවිසුම් 41

සංවර්ධනයට එරෙහි මිථ්‍යා විශ්වාස 42

ආදායම් විෂමතාවය ගැන ඇත්ත සහ යථාර්ථය 43

ධනපතියන් අත මුදල් නැත. ධනය සමාජයීය වෙයි 45

සමස්ත ජනතාවගේ සංවර්ධනය 47

පරිච්ඡේදය 1

# ආර්ථික බිඳවැටීමක් දක්වා ගිය අර්බුදය

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය ගැන කතා කරන විට සැම දෙනාගේ ම පාහේ මතකයට නැගෙන්නේ 2022 වසරේ සිදු වූ ආර්ථික බිඳවැටීම යි. එනම්, ජන ජීවිත සාමාන්‍ය පරිදි පවත්වාගෙන යා නොහැකි තරමට අර්බුදය උත්සන්න වීම යි.

2022 මාර්තු මාසය වන විට රටේ පැවතියේ අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයුම සහ සේවා පවත්වාගෙන යා නොහැකි තත්ත්වයකි. එය ප්‍රදර්ශනය වුයේ ගෑස් පෝලිම්, ඉන්ධන පෝලිම්, කිරිපිටි පෝලිම් ආදී වශයෙනි. මහජනයාට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ඖෂධ පවා හිඟ වී තිබිණි. පෝලිම්වල සිදු වූ මරණ ගැන පවා වාර්තා වුයේ දින ගණන් එක දිගට පෝලිම්වල සිටින්නට ජනයාට සිදු වී තිබීම හේතුවෙනි.

රටට අත්‍යවශ්‍ය භාණ්ඩ රැගෙන පැමිණි නැව් වරායේ සිර වී තිබුණේ ඒවාට මුදල් ගෙවීමට විදේශ විනිමය හෙවත් ඩොලර් සපයාගැනීමේ නොහැකියාව හේතුවෙනි. ඉන්ධන නැව් සහ ගෑස් නැව් සඳහා ද මුදල් ගෙවීමේ හැකියාවක් නොවී ය. ඉන්දියාවෙන් සහ සුළු වශයෙන් වුවත් බංග්ලාදේශයෙන් ලැබුණු ආධාර නොවන්නට තත්ත්වය තවත් බරපතළ වන්නට ඉඩ තිබිණි.

මෙහි අනෙක් සුවිශේෂී කරුණ නම් මෙම දරුණු ආර්ථික කඩා වැටීමෙන් ගොඩ යෑම පිළිබඳ උපායමාර්ගයක් හෝ පැහැදිලි අදහසක් රජයට නොවීම යි. එවකට සිටි ඇතැම් බලධාරීන් නොයෙකුත් සැලසුම් ගැන කීව ද, ඒ කිසිවක් ප්‍රයෝගික යථාර්ථයක් බවට පත්වන ලකුණක් හෝ පෙනෙන්නට නොතිබිණි.

මෙම ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් දක්වා වර්ධනය වී යම් ආකාරයක දේශපාලන පෙරළියක් ඇති වූ බව සහ රටේ ආර්ථිකය නව මාවතකට යොමු වූ බව දැන් අප දන්නා කාරණයකි. පැවති අර්බුදය දැන්

යම් ප්‍රමාණයකට සමනය වී ඇති බව පැහැදිලි කාරණයකි. එසේ වුව ද, රට අර්බුදයෙන් සම්පූර්ණයෙන් ගොඩගිය බවක් එයින් අදහස් වන්නේ නැත. අර්බුදයෙන් රට සම්පූර්ණයෙන් ගොඩ ගෙන සමෘද්ධිමත් රටක් බවට පත් කිරීමට තවත් බොහෝ දේ කළ යුතුව ඇත. එමෙන් ම, දැන් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිබඳව ද විවිධ වූ විවේචන පවතින බව ද පෙනෙන්නට තිබේ. ඒ සියල්ල පිළිබඳ අධ්‍යයනයක් සහ සමාලෝචනයක් දැන් අවශ්‍ය වී තිබේ.

මෙහි දී ඇත්ත අර්බුදය කුමක්ද යන්න තේරුම් ගැනීම අවශ්‍ය වෙයි. එමෙන් ම එය වර්ධනය වූ ආකාරය හැදෑරීමෙන් ද අපට පාඩම් උගත හැකි ය. අර්බුදයෙන් මිදීමට මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවායේ ප්‍රතිඵල හඳුනාගැනීම ද අවශ්‍ය වෙයි.

එමෙන් ම  වඩා වැදගත් කාරණය වන්නේ අර්බුදයෙන් සම්පූර්ණයෙන් ගොඩ යමින් රටේ සහ ජනතාවගේ සමෘද්ධිය ළඟා කර ගැනීම සඳහා කළ යුතු දේ තේරුම් ගෙන එම වැඩ පිළිවෙළ ක්‍රියාවට නැගීමට කැපවීම යි.

## අර්බුදයට හේතු ගැන කියන කතා

ආර්ථික අර්බුදයට හේතු ලෙස විවිධ කරුණු සාකච්ඡාවට ලක්ව ඇත. ඒවායින් එකක් හෝ ගණනාවක් ආර්ථික අර්බුදයට දායක වූ බව කියනු අසන්නට ලැබේ.

ඒ අතරින් ප්‍රධාන කරුණු වන්නේ

1. ඵලදායී නොවන ව්‍යාපෘති සඳහා අධික පොලියට ණය ගැනීම.
2. රාජ්‍ය යන්ත්‍රයේ පැතිරුණු සහ විශේෂයෙන් ඉහළ දේශපාලනඥයන්ගේ සහ පවුල්වල වංචා සහ දූෂණ.
3. ආර්ථික වර්ධනය සඳහා විධිමත් සැලසුම් නොවීම.
4. රාජ්‍ය සේවය අසීමිත ලෙස පුළුල් කිරීම.
5. රාජ්‍ය ව්‍යවසාය පාඩු ලබමින් දිගට ම පවත්වාගෙන යෑම.
6. බදු කපා හරිමින් රජයේ ආදායම් අහිමි කර ගැනීම.
7. කොරෝනා වසංගතය සහ එය පාලනයේ දී අවිචාරවත් ලෙස ක්‍රියා කිරීම.
8. ගොවිතැන වහා කාබනික කිරීමේ උත්සාහයේ විපාක.

9. රජයේ වියදම් පියවා ගැනීම සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය සහ එමගින් රුපියලේ හුවමාරු අගය පහළ වැටීම.
10. රුපියලේ අගය කෘත්‍රිම ලෙස රැකගැනීම සඳහා ඩොලර් සංචිත නාස්ති කිරීම.

ආදිය යි.

මෙම කරුණු ආර්ථික අර්බුදය උත්සන්න වීමට සහ විශේෂයෙන් එය ඉක්මන් ආර්ථික කඩාවැටීමක් දක්වා වර්ධනය වීමට හේතු වූ බවට සැක නැත. ඒ පිළිබඳ බොහෝ කරුණු පසුගිය කාලයේ සාකච්ඡාවට ලක්ව ඇත. එබැවින් එම කරුණු නැවත නැවත පැවසීම අවශ්‍ය නොවේ. එසේ වුව ද, අර්බුදය තේරුම්ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට ප්‍රධාන කරුණු මතක් කර ගැනීම වැදගත් වෙයි.

එලෙසම මතක තබා ගත යුතු කරුණක් වන්නේ ඉහත කී කරුණු සියල්ල ම පාහේ ආර්ථික අර්බුදය උත්සන්න කළ සහ එය ආර්ථික කඩා වැටීමක් දක්වා වර්ධනය කිරීමට හේතු වූ කරුණු මිස සැබෑ ආර්ථික ප්‍රශ්නය එය නොවන බව යි. එම ප්‍රශ්නය හඳුනාගැනීම දෙවනුව කිරීමට ඉඩ තබා ගනිමින් අර්බුදය උත්සන්න කිරීමට හේතු වූ ඉහත කී කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වෙයි.

## උගුලක් වූ ණය ගැනීම්

සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය ලබා ගැනීම ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. විවිධ වූ කුඩා ව්‍යාපෘති සඳහා මෙන් ම මහවැලි ව්‍යාපාරය වැනි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ද ක්‍රියාත්මක කරන ලද්දේ විදේශ ණය උපයෝගී කරගෙන ය. අතීතයේ එම ණය හැම විට ම පාහේ ලැබුණේ සහන ණය වශයෙනි. එනම්, අඩු පොලියකට සහ ණය ගෙවීමට සහන කාලයක් සමග දිගු කලක් ලැබෙන අයුරිනි.

එමෙන් ම එම ණය ලබා දුන්නේ අදාළ ව්‍යාපෘති පිළිබඳ සක්‍යතා අධ්‍යයනවලින් පසුව ය. එනම්, එමගින් රටට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව අධ්‍යයනයකින් පසුව ය.

කෙසේ වෙතත්, අවසන් දශක දෙකක පමණ කාලයේ දී, මෙරටට ණය ලබාගැනීමට නව මූලාශ්‍ර විවෘත වී ය. එයින් පළමුවැන්න චීනයෙන් ලැබුණු ණය යි. එම ණය සඳහා ගෙවන පොලිය වැඩි වූ අතර ණය ගෙවීමට ලැබෙන කාලය එතරම් දිගු නැත.

එසේ වුව ද, තම ණය මගින් කරන ව්‍යාපෘතිවල ඵලදායීතාවය ගැන චීනය එතරම් උනන්දු වුයේ නැත. එමෙන් ම ණය ලබා ගැනීම ද ඉක්මනින් කළ හැකි වී ය. එබැවින් මෙම ණය මුලාශ්‍රය ඇතැම් දේශපාලනඥයින්ට ඉතා ආකර්ශනීය වී ය.

නැව් නොඑන වරායක් ලෙස හඳුන්වනු ලැබූ හම්බන්තොට වරාය, ගුවන් යානා නොඑන මත්තල ගුවන් තොටුපළ, ක්‍රීඩා තරග නැති සූරියවැව ක්‍රීඩාංගනය ඉදිවන්නේ ඒ ආකාරයෙනි. ඇතැම් මාර්ග සංවර්ධනය සම්බන්ධයෙන් ද තත්ත්වය ඒ හා සමාන ය. මේවා රටට ලැබී ඇත්තේ ආදායම් ජනිත නොකරන වියදම් වශයෙනි. ඒ සියල්ල සඳහා ගෙවන්නට ජනතාවට සිදු වී තිබේ.

2007 වසරේ සිට ශ්‍රී ලංකා රජය තවත් විදේශීය ණය ගැනීමේ මාවතක් විවෘත කර ගත්තේ ය. එනම් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරමින් පෞද්ගලික අංශයෙන් ණය ලබා ගැනීම යි. එය කළේ රජයේ ඩොලර් බැඳුම්කර නිකුත් කිරීම් වශයෙනි. මෙම බැඳුම්කර නිශ්චිත කාල සඳහා ලබාගත් අතර කාලය අවසානයේ එකවර ගෙවිය යුතු වී ය. එමෙන් ම, එම බැඳුම්කර සඳහා ගෙවිය යුතු පොළිය ද ඉහළ මට්ටමක වී ය.

මෙරට පාලකයින් සහ නිලධාරීන් මෙම ක්‍රමයට ප්‍රිය කළේ එම ණය කුමන හෝ ව්‍යාපෘතියක් සඳහා නිශ්චිත නොවූ නිසා ය. එනම්, එම මුදල් පාලකයින්ට කැමති ඕනෑම කටයුත්තකට යොදා ගත හැකි වීම යි. එබැවින් එම මුදල් වියදම් කිරීම ගැන කිසිදු සීමා කිරීමක් තිබුණේ නැත.

මෙලෙස ජාත්‍යන්තර බැඳුම්කර මගින් ලබාගත් ණය ගෙවීම සඳහා ආදායම් ඉපයීමේ කිසිදු ක්‍රමවේදයක් නොතිබිණි. හැම විට ම කළේ තව තවත් ණය ලබා ගනිමින් පැරණි ණය ගෙවීම යි.

ගැලවීමක් නැති ණය උගුලක් නිර්මාණය වන්නේ ඒ ආකාරයෙනි. එනම්, ණය ගෙවීමට තවත් ණය ගැනීම හැර වෙනත් මාවතක් නොමැති තත්ත්වයක් නිර්මාණය වීම යි.

අන්තර්ජාලයේ 'ඉකොනොමැට්ටා' බ්ලොග් අඩවිය පවත්වාගෙන යන මහාචාර්ය විදුර තෙන්නකෝන් මහතා සිය ලිපියක පෙන්වා දී තිබුණේ 2015 - 2019 කාලයේ ලබාගත් ණය වලින් සියයට 91.4 ක් යොදාගෙන ඇත්තේ පැරණි ණය සහ පොලී ගෙවීමට බව යි.

ආර්ථික විද්‍යා බුද්ධි මණ්ඩපයක් වන 'අඩ්වෝකාටා' ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ධනනාත් ප්‍රනාන්දු මහතා අන්තර්ජාලයට එක් කළ වීඩියෝවක පෙන්වා දී ඇත්තේ මෙතෙක් ගෙන ඇති සම්පූර්ණ ණය ප්‍රමාණයෙන් සියයට 40 ක් යොදාගෙන ඇත්තේ ණය සඳහා පොලිය ගෙවීමට බව යි. සියයට 34ක් ණය වැඩි වී ඇත්තේ රුපියල අවප්‍රමාණ වීම නිසා ය. රාජ්‍ය ව්‍යවසායවල පාඩු පියවීමට සියයට අටක් යොදා ඇත. කුමන හෝ රාජ්‍ය වියදමකට යොදාගෙන ඇත්තේ ගත් ණයවලින් සියයට 16ක් තරම් වූ සුළු ප්‍රමාණයකි.

මෙලෙස රට පත්වන්නේ ණය ගෙවීමට ණය ගැනීමේ තත්ත්වයකට ය. එයට ණය උගුලක පැටලීමක් කියා කීමේ වරදක් නැත. මෙහි ඇති එක ම වෙනස මෙය අප විසින් ම අටවාගත් උගුලක් වීම යි.

## ඉහවහාගිය දූෂණය සහ එහි ආර්ථික බලපෑම

පසුගිය කාලයේ මෙරට අල්ලස, දූෂණය සහ සොරකම ඉහවහාගිය තත්ත්වයක් පැවති බව අවිවාදිත කාරණයකි. එමගින් යම් යම් දේශපාලනඥයින්, නිලධාරීන් සහ බලවතුන්ගේ පවුල්වල උදවිය ද අයුතු ලෙස ධනය ඉපයූ බව ද රහසක් නොවේ. පසුගිය කාලයේ විවිධ ස්ථානවලින් මන්දිර සොයාගත හැකි වී ය. ඇතැම්, මහ මන්දිරවලට හිමිකරුවෙකු ඉදිරිපත් නොවීම නිසා රජයට අයත් වීම ද සිදු වී තිබේ. ඇත්ත කතාව බොහෝ දෙනාට පැහැදිලි බවට සැකයක් නැත. නමුත් ඒවා සලකන්නට සිදු වී ඇත්තේ නොවිසඳුණු අපරාධ වශයෙනි. එසේ වුව ද, ඒවා දූෂණය පිළිබඳ සාක්ෂි වශයෙන් පවතියි.

එමෙන් ම ඇතැම් දූෂණ ගැන හෙළිදරව් වුයේ වෙනත් ජාත්‍යන්තර පරීක්ෂණවල ප්‍රතිඵල වශයෙනි. ඒ පිළිබඳව වැඩි දුර සොයන්නට ද අපට හැකි වී නැත.

අල්ලස් ගනිද්දී අතට ම අසු වූ නිලධාරීන් ගැන ද අමතක කළ නොහැකි ය.

හෙළිදරව් කරගත් වංචා දූෂණ ගැන තිබූ අධිකරණ ක්‍රියාමාර්ග පසුගිය කාලයේ අත්හැර දමනු ලැබී ය. සිදුවෙමින් තිබූ පරීක්ෂණ ද නැවතිණි. එසේ සිදු වුයේ, දූෂිතයින් ලෙස හඳුනාගත් පිරිස මෙරට ජනයාගේ ඡන්දයෙන් බලයට පත්කරනු ලැබූ නිසා ය. දූෂිතයින් ඇල්ලිය යුතු බව කියා දැන් නැවත හඬ නගන්නේ ද දූෂිතයින්ට ඡන්දය දී බලයට පත් කළ ජනතාව ම ය.

ඒ අපේ රටේ ජනතවගේ හැටි ය. කරන සියලු දේ කළ යුත්තේ අපට ඉන්නේ මෙබඳු ජනතාවක් ය යන්න ද සිහි තබාගෙන ය.

දූෂිතයින් සොරාගත් මුදල් ප්‍රමාණ සහ ඒවා ආපසු ලබාගෙන රටේ ආර්ථික ප්‍රශ්න විසඳිය හැකි බව ආදී කරුණු පිළිබඳව දේශපාලන සාකච්ඡාවක් පවතිනු දක්නට ඇත. මුදල් ආපසු ලබාගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරන පිරිස නොයෙකුත් ගණන් හිලව් ද ඉදිරිපත් කොට ඇත.

මෙම ප්‍රශ්නය සාකච්ඡා කළ යුතුව ඇත්තේ එමගින් දූෂණය පිළිබඳ ඇත්ත ප්‍රශ්නය වෙනුවට ව්‍යාජ ප්‍රශ්නයක් ඉදිරියට දමන හෙයිනි. එයින් සොරකම් කළ මුදල අතිශයෝක්තියෙන් දක්වන අතර දූෂණය නිසා රටට සිදු වූ ඇත්ත විනාශය හඳුනාගැනීමට අපොහොසත් වෙයි.

පළමු කාරණය නම් සොරකම් කොට කොහේ හෝ සඟවා ඇතැයි කියන මුදල රටේ වත්මන් අර්බුදයේ මට්ටම සමග සංසන්ධනය කළ විට විශාල මුදලක් විය නොහැකි වීම යි.

සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පෙන්වා දුන් පරිදි දේශපාලනඥයින් මුදල් සොරකම් කළ බව කියන ව්‍යාපෘතිවල සමස්ත වියදම ද ඩොලර් බිලියන ගණනකට සීමා වෙයි. විශාලතම වියදම වන හම්බන්තොට වරායේ වියදම ඩොලර් මිලියන 1300 කි. බිලියන 1.3 කි. අනෙක් ව්‍යාපෘතිවල වියදම ඊට අඩු ය. චීන එක්සිම් බැංකුවෙන් ගත් ණය මුදල ඩොලර් බිලියන 4.5 කි.

වෙනත් ආකාරයකින් බැලූ විට රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් බිලියන 80 ක් පමණ වුවකි. එබඳු ආර්ථිකයකින් ඩොලර් බිලියන තිහ හතළිහක් සොරකම් කොට ඇතැයි පිළිගැනීමට හේතු නැත.

මෙම වියදම් අතරින් සියයට 10 ක් සොරකම් කළේ නම් එය ඩොලර් මිලියන සිය ගණනක් හෝ බිලියනයක් දෙකක් විය හැකි ය. එය පුද්ගලයකුට, පවුලකට හෝ කණ්ඩායමකට හෝ අති විශාල මුදලකි. පරම්පරා ගණනකට ප්‍රමාණවත් විය හැකි ය. නමුත් රටක ආර්ථිකයට එය සොච්චම් මුදලකි.

ණය ප්‍රතිව්‍යුහගත කරණයෙන් පසුව ද ශ්‍රී ලංකාවට වසරකට ගෙවන්න වන ණය ප්‍රමාණය ඩොලර් බිලියන තුනක් බව කියති. දේශපාලකයින් සොරකම් කොට සඟවා ඇතැයි කියන මුදල කෙසේ හෝ සොයාගෙන ජාත්‍යන්තර අධිකරණ ක්‍රියාවලීන් අනුගමනය කොට මෙරටට ගෙනෙන්නට හැකි වුවත්, එක වසරක ණය වාරික ගෙවීමට ප්‍රමාණවත් වේ දැයි සැක සහිත ය.

එබැවින් සොරකම් කොට සඟවා ඇති ධනය නැවත මෙරටට ලබා ගැනීමට ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වන නමුත්, එය රටේ ආර්ථිකය ගොඩ දැමීමේ මාවත ලෙස දැකීම වරදකි.

ඇතැම් විට සොරකම් කළ ධනය ගෙනෙන්නට කතා කරන උදවිය ද මේ යථාර්ථය නොදැන සිටිනවා නොවිය හැකි ය. එසේ වුවත්, එය ඉදිරිපත් කරන්නේ දේශපාලන වශයෙන් ජනප්‍රිය සටන්පාඨයක් ලෙස සලකන නිසා විය හැකි ය.

අනෙක් අතට එලෙස සොරකම් කළ ධනය මෙරටට ලබාගැනීම සඳහා රජය ද අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරමින් සිටින බව ද මතක් කිරීම වැදගත් ය. මෙරට අධිකරණ බල ප්‍රදේශයෙන් පිටත ඇති ධනය මෙරටට ලබා ගැනීමට නව නීති අවශ්‍ය වෙයි. ඒ සඳහා නීති කෙටුම්පත් කිරීම මේ වනවිට අවසන් අදියරේ ඇති බව වාර්තා වෙයි. එය කෙටුම්පත් කිරීම සිදුකොට ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ, වංචා හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් සරත් ජයමාන්න ඇතුළු කණ්ඩායමක් විසිනි.

## දූෂණයේ විනාශයේ වැරදි තැනින් ඇල්ලීම

දූෂිතයින් විසින් සොරකම් කොට විදේශවල සඟවා ඇති ධනය මෙරටට ගෙන එමෙන් මෙරට ආර්ථික ප්‍රශ්න විසඳන්නට කතා කරන විපක්ෂයේ ප්‍රධාන පක්ෂ ඒ සමග ම කියන්නේ ආර්ථිකය වැටුණේ රටේ ධනය සොරකම් කළ නිසා බව යි. නිවැරදි යැයි මතුපිටින් පෙනුන ද මෙය අතිශයින් නොමග යවන සුළු ප්‍රකාශයකි.

මෙම ප්‍රකාශය නිවැරදි නම් එයින් වෙනත් ආකාරයකින් කියැවෙන්නේ මෙරට ආර්ථිකයේ විශාල වර්ධනයක් සිදු වී විශාල ධනයක් නිෂ්පාදනය වූ බව යි. එම මතයට අනුව වරද වී ඇත්තේ එසේ නිෂ්පාදනය වූ විශාල ධනස්කන්ධය කිසියම් පිරිසක් විසින් සොරකම් කරනු ලැබීම යි.

මෙය නොමග යවන සුළු ස්ථාවරයකි. ඇත්ත ප්‍රශ්නය නම් මෙරටෙහි ජන ජීවිත පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් ධනයක් නිෂ්පාදනය නොවීම යි. දූෂිත ක්‍රමය, යහපත් සහ ඉහළ ආර්ථික වර්ධනයකට ඉඩ දුන්නේ නැත. රටට අවශ්‍ය ආයෝජන සිදුවුයේ නැත. ආර්ථික වර්ධනය මන්දගාමී වී ය. රටේ ජනතාවගේ පැවැත්ම සඳහා ලෝකයට ණය වෙමින් ණය උගුලකට රට ගමන් කළේ එහි ප්‍රතිඵල වශයෙනි.

ඒ අනුව දූෂිත පැලැන්තිය රටේ ආර්ථිකයට කළ සැබෑ හානිය ඔවුන් සොරකම් කළ මුදලට වඩා අති විශාල ය. දැවැන්ත ය.

ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ සාකච්ඡාවක දී අප ප්‍රශ්නයේ තවත් පැත්තක් තේරුම් ගත යුතුව ඇත. එනම්, මෙලෙස යම් පවුලකට හෝ කණ්ඩායමකට හෝ මෙම විනාශය කිරීමට අවස්ථාව ලැබුණේ කෙසේ ද යන කාරණය යි. එයට හේතුව නම් අප කලක් තිස්සේ සමාජයක් ලෙස දූෂිතයින් බවට පත්ව සිටීම යි. රජයේ සේවා සැපයීමේ දී ඉහළ සිට පහළට තිබෙන දූෂණය ගැන මෙරට ජනතාවට අමුතුවෙන් කිව යුතු නැත. ඒවා අධ්‍යයනය කළහොත් පොත් ගණනාවක් ලිවීමට ප්‍රමාණවත් ය.

ඇතැමෙකු තර්ක කරන්නේ මෙය මෑත කාලීන ප්‍රවණතාවක් බවට ය. සමහරු එය පෙන්වනට හදන්නේ 1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථිකයේ ප්‍රතිඵලයක් වශයෙනි. එසේ වුවත්, 1977 ට පෙර පැවති දූෂිත තත්ත්වය ගැන එකල ගැන අත්දැකීම් ඇති වැඩිහිටියෝ දනිති. රජයේ සංස්ථා, මණ්ඩලවල දූෂණ එමට තිබිණි. සමුපකාර අන්ත දූෂිත ආයතන බවට පත්ව තිබිණි. ලංගම බස් රථයකට නව ටයරයක් සවිකළ විට දින කිහිපයකින් එය කළු කඩයට විකුණා පැරණි ටයරයක් යළි සවි කිරීම වැනි තත්ත්වයට දූෂණ පැතිරී තිබිණි. රජයේ වාහනවල ඉන්ධන ඇද විකිණීම සුලබ සිදුවීමකි. ඒවා නැවත්වීමට ධාවන සටහන් පොත් හඳුන්වා දුන්න ද, වාහනයේ ඉන්ධන දහනය වැඩියෙන් පෙන්වා සොරකම නීතිගත කර ගැනීමට තරම් රියදුරෝ නැතහොත් නිලධාරීහු දක්ෂ වූ හ.

දූෂණ පිටුදැකීම 1977 මැතිවරණයේ ද ප්‍රධාන සටන් පාඨයක් වී ය. නමුත්, භාවිතයේ දී එය දේශපාලන පළිගැනීමකට සීමා වී ය. ජනාධිපති කොමිසමකින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සහ පීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතාගේ ප්‍රජා අයිතිය අහෝසි කළේ ඒ අනුව ය.

1994 ආණ්ඩුව ද බලයට ආවේ දූෂිතයින් ගෝල්ෆේස් පිට්ටනියේ එල්ලන බව කියාගෙන ය. එය එසේ සිදු වුයේ නැත. නමුත් අල්ලස් හෝ දූෂණ ක්‍රියා විමර්ශනය සඳහා කොමිසන් සභාවක් පිහිටුවනු ලැබීය. එයින් ද අපගේ රට දූෂණයෙන් ගලවා ගැනීමට නොහැකි වූ බව දැන් අපි දනිමු.

මෑත කාලයේ සිදුවුයේ අපගේ දූෂිත සමාජයේ පැවති දූෂණ සඳහා විවෘත රාජ්‍ය අනුග්‍රහය හිමි වී එය උපරිම මට්ටමට පත්වීමකි.

මෙය මෙලෙස තේරුම් ගත යුතු වන්නේ හුදෙක් දූෂිතයින් කියන පිරිස පමණක් දඬු කඳේ ගැසීම ප්‍රශ්නයට සම්පූර්ණ විසඳුමක් නොවන බව තේරුම් ගැනීම සඳහා ය.

මෙම කරුණු සලකා බැලූ විට කරුණු කිහිපයක් පැහැදිලි විය යුතු ය.

පළමු කරුණ නම් දූෂණය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රශ්නය වන්නේ දූෂණයෙන් සොරාගත් මුදල් ප්‍රමාණය නොවන බව යි. විශාල මුදලක් සොරකම් කිරීමට තරම් විශාල ආර්ථික සංවර්ධනයක් රටේ සිදුවුයේ නැත. සොරකම් කළේ විවිධ ව්‍යාපෘති සඳහා ගත් ණයවලින් කොටසකි. එය ද වැඩි කොටස නොවේ. වැඩි කොටස පවතින්නේ නාස්තිකාර වියදමක් වශයෙනි. සොරකම් කළ මුදල පුද්ගලයකුට, පවුලකට හෝ කණ්ඩායමකට හෝ විශාල මුදලක් වුව ද, රටේ ආර්ථිකයට එය කුඩා මුදලකි. එම මුදල් ලබාගෙන ආර්ථිකය ගොඩ දැමිය හැකි යැයි සිතීම මෝඩ කමක් බව නැවත අවධාරණය කරමි.

අනෙක් කරුණ නම් දූෂණ නිසා රටේ ආර්ථිකයට සිදු වූ විනාශය සොරකම් කළ මුදලට වඩා අති විශාල වීම යි. එය ගණන් බැලිය නොහැකි තරම් ය. එය හැඳින්විය හැක්කේ අපරාධයක් වශයෙනි.

තෙවැනි කරුණ නම් යම් කණ්ඩායමක් දූෂණය එහි ඉහළ ම තලයකට රැගෙන ගිය බව සැබෑ වුවත්, අපගේ සමස්ත සමාජය ම දූෂිත වී ඇති බවත්, එය කලෙක සිට පවතින්නක් බවත්, තේරුම් ගත යුතු බව යි. දූෂණයට විසඳුම් සෙවීමට මෙම තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වෙයි.

සිව් වැනි කරුණ ලෙස තේරුම් ගත යුතු වන්නේ දූෂණය නම් ප්‍රශ්නයේ යථාර්ථය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කරනවා වෙනුවට එය දේශපාලන ප්‍රයෝජන සඳහා සටන්පාඨයක් පමණක් බවට පත්කර ගැනීම වඩා හානිකර බව යි. බලයේ සිටින සහ සිටි පක්ෂවලට දූෂණ චෝදනාවලින් දමා ගැසීම පසුගිය සෑම මැතිවරණයක දී ම අපි දැක ඇත්තෙමු. එයින් නියෝජනය වන්නේ හුදු අවස්ථාවාදයක් මිස සැබෑ දූෂණ විරෝධයක් නොවේ. එයින් අවසානයේ කිසිදු ප්‍රතිඵලයක් අත් වන්නේ නැත.

## දූෂිත දේශපාලන ක්‍රමයේ අතුරු ප්‍රශ්න

ආර්ථිකයේ බිඳ වැටීමක් දක්වා 2022 දී වර්ධනය වූ ආර්ථික අර්බුදයට හේතු ලෙස ප්‍රකාශ වන ඇතැම් කරුණු හඳුනාගත හැකි වන්නේ දූෂිත දේශපාලන ක්‍රමයේ ම ප්‍රතිඵල වශයෙනි.

දූෂිත දේශපාලනය තුළ නිර්මාණය වී තිබුණු ක්‍රමය තුළ රටේ දේශපාලන, ආර්ථික සියලු තීරණ ගන්නා ලද්දේ රටේ උන්නතිය අරමුණු කරගෙන නොව

තම තමන්ට ලැබෙන පෞද්ගලික වාසි සලකාගෙන ය. එය මැතිවරණ ක්‍රමය තුළ පවා දක්නට ලැබිණි. හඳෙන් හාල් ගේන්න, ධාන්‍ය රාත්තල් අටක් දෙන්න, තුනයි පනහට පාන් දෙන්න, පොරොන්දු වන උදවිය ජනතා ඡන්දයෙන් බලයට පත්වන්නේ ඒ නිසා ය.

රටේ ආර්ථික, සංවර්ධන තීන්දු ගන්නා දේශපාලනඥයින් සහ නිලධාරීන් බොහෝ දෙනා ද තීරණ ගත්තේ රටේ යහපත සලකා නොව තමන්ගේ ලාභ අපේක්ෂාව සඳහා ය.

ඒ අතර රටේ යහපත වෙනුවෙන් ක්‍රියා කළ දේශපාලනඥයින් මෙන් ම නිලධාරීන් ද සිටිය බව ද, ඔවුන් රටට යම් සේවයක් කළ බව ද අමතක කළ යුතු නැත.

වසර 75 ක් මෙරටේ කිසිවක් සිදු වී නැතැයි කීම සහ රට විනාශයට යෑම පමණක් සිදු වූ බව කීමේ සත්‍යයක් නැත. රටට අවශ්‍ය සහල් සියයට 85 ක් ආනයනය කළ රට සහලින් ස්වයංපෝෂිත වුයේ මෙම කාලයේ දී ය. මහවැලි ව්‍යාපාරය, නිදහස් වෙළෙඳ කලාප ඇතිවුයේ මේ කාලයේ දී ය. ශ්‍රී ලංකාව කාර්මික නිෂ්පාදන අපනයනය කරන රටක් වුයේ මේ කාලයේ ය.

මෙරට නිදහස ලබන විට අවුරුදු 45ක් 50ක් ලෙස තිබු උපතේ දී ආයු අපේක්ෂාව 77 - 78 දක්වා ඉහළ ගියේ මෙම කාලයේ ය. ළදරු මරණ අඩු වී ය. මාතෘ මරණ අඩු වී ය. ඇතැම් රෝග රටින් තුරන් කරනු ලැබීය..

නිදහස් අධ්‍යාපනය පුළුල් වුයේ මෙම කාලයේ ය. දැන් එමගින් ජනතාවගේ බහුතරයකට සමාජ ප්‍රගමනයේ අවස්ථා හිමි කර දී තිබේ. තරුණයන්ට විදෙස් ගත වී වඩා හොඳ ජීවන තත්ත්වයන් සොයා යන්නට අවස්ථාව ලැබුණේ නිදහස් අධ්‍යාපනයට පින් සිදු වන්නට ය.

මෙම ලැයිස්තුවට තවත් බොහෝ කරුණු එකතු කළ හැකි ය. මේ කරුණු කීවේ යම් සිහිපත් කිරීමක් වශයෙන් පමණකි.

අතීතයේ මෙරට සිටි පරම්පරාව තම අනාගතය විනාශ කොට ඇතැයි ඇතැම් තරුණ පිරිස් පසුගිය කාලයේ දෙස් තිබ්බේ කවුරුන් හෝ ඒ බව ඔවුන්ට පැවසු නිසා විය හැකි ය. ඔවුන් එසේ කියන විට ඔවුන් අතේ නවීන ස්මාර්ට් දුරකථන තිබිණි. ඔවුන් තම අදහස් සන්නිවේදනය කළේ ඒවා උපයෝගී කරගෙන ය. මෙම නවීන ස්මාර්ට් දුරකථන තමන් අතට ලැබුණේ කෙසේ දැයි ඔවුන්ට කල්පනා නොවීම කණගාටුවට කරුණකි.

මේ කියන්නේ අතීතයේ සියලු දේ යහපත් ලෙස සිදු වූ බව නොවේ. අප රටට යා හැකිව තිබූ දුර යන්නට අපට නොහැකි වී ය. අතීතයේ නිවැරදිව ක්‍රියා කළේ නම් අද තිබෙන ප්‍රශ්න බොහොමයක් විසඳාගත හැකිව තිබිණි. දියුණු රටක් වීමට අපට තිබු අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට අපට නොහැකි වී ය. ඒගැන විවේචනය අත්‍යවශ්‍ය ය.

එසේ වුව ද අපගේ විවේචනය සත්‍ය ගරුක සහ යථාර්ථවාදී විය යුතු ය. සැබැවින් ම සාර්ථක විසඳුම් සොයා ගැනීමට අපට හැකි වන්නේ එවිට ය.

කෙසේ වෙතත්, එක් දෙයක් පැහැදිලි ය. විධිමත් සැලැස්මක් අනුව රට සංවර්ධනය කිරීමට අපට හැකි වී නැත. එයට ප්‍රධාන හේතුවක් වුයේ සමාජයක් ලෙස පැවති දුෂණය මෙන් ම ඒ හා බැඳුනු මතවාදී තත්ත්වය යි.

## ආර්ථිකයට දැරිය නොහැකි රාජ්‍ය සේවය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය ආර්ථිකයට දැරිය නොහැකි තරම් විශාල ආකාර්යක්ෂම එකක් බව දැන් බොහෝ දෙනා පිළිගන්නා කාරණයකි. දේශබන්දු කරු ජයසූරිය මහතා මෑතක දී ප්‍රකාශ කළ පරිදි ජනගහනයේ පවුල් දහසකට සිටිය යුතු රජයේ සේවක සංඛ්‍යාව 13ක් බවයි. අප රටේ සිටින සංඛ්‍යාව 250 කි.

මෙරට රජයේ සේවය විවිධ ආණ්ඩු යටතේ පුළුල් කරන ලද්දේ රටේ සහ ජනතාවගේ අවශ්‍යතා හෝ කාර්යක්ෂම ලෙස සේවා සැපයීම හෝ ගැන සලකා නොවේ. රාජ්‍ය සේවය සලකන ලද්දේ රැකියා සපයන ක්ෂේත්‍රයක් වශයෙනි. බලයේ සිටින පක්ෂයේ ආධාරකරුවන්ට වැඩි වැඩියෙන් රැකියා සැපයීම සඳහා විවිධ රැකියා නිර්මාණය කරනු ලැබී ය.

දැන් එය තිබෙන්නේ රටට දැරිය නොහැකි වියදමක් වශයෙනි. රටේ සංවර්ධනයට යෙදවිය හැකි විශාල මුදලක් නිතිපතා නාස්ති කරන ක්ෂේත්‍රයක් බවට රාජ්‍ය සේවය පත්ව තිබේ.

එසේ තිබිය දී ත්, ආණ්ඩු කළේ රාජ්‍ය සේවයට තව තවත් පිරිස් බඳවා ගැනීම යි. කරන්නට කාර්යයක් නැති පිරිසක් ද රාජ්‍ය සේවය තුළට ඇතුළත් කොට වැටුප් ගෙවන්නට පටන් ගත්තේ ආර්ථිකය හොඳට ම පල්ලම් බසිමින් තිබිය දී ය.

ආර්ථිකය බිඳ වැටෙන තත්ත්වයට පත්වීමට එය ද එක් හේතුවකි.

## රාජ්‍ය ආයතන

රාජ්‍ය ආයතන පාඩු ලබමින් පවත්වාගෙන යෑම සිදු වුයේ ද දේශපාලන වුවමනාවන් අනුව ය. ඒවා පවත්වාගෙන යෑමේ ප්‍රකාශිත අරමුණ මහජන සේවය වුව ද, ඇත්තට ම ඒවායේ සේවය ලැබුවේ දේශපාලනඥයින්, නිලධාරීන් සහ එම ආයතනවල සේවකයින් බව පෙනෙන්නට තිබේ.

දේශපාලනඥයින්ට මේවා රැකියා දීමේ ආයතන ලෙස වැදගත් වී ය. දේශපාලනඥයින්ට සහ නිලධාරීන්ට විවිධ ගනුදෙනු කර ගැනීමට ද මේවා යොදා ගනු ලැබී ය. සේවකයින්ට ද විශාල වරප්‍රසාද ලබා දී තිබූ බව පසුගිය කාලයේ ඉතා පැහැදිලි ලෙස හෙළිදරව් වී ය. සේවකයින් ඒවාට කියන්නේ අයිතිවාසිකම් කියා ය.

මේ සියල්ලට ගෙවන්නේ මහජන මුදලිනි.

එසේ වුව ද, මේවා ප්‍රතිසංවිධානය කිරීමට එරෙහිව තවමත් පිරිසක් ක්‍රියා කරති.

## බදු අඩු කිරීම

වැට් බදු සහ ආදායම් බදු විශාල ලෙස අඩු කිරීමට 2019 බලයට පත් රජය ක්‍රියා කළේ රජයේ වියදම් පියවා ගැනීමට කිසිදු විකල්ප මාර්ගයක් නොමැතිව ය.

මෙම තීරණය ගන්නා ලද්දේ තමන් ආර්ථික කළමනාකරණය සඳහා පැවති ක්‍රමයට විකල්ප සාර්ථක ක්‍රමයක් ක්‍රියාවට නගන්නේ යැයි සිතා සිටි පිරිසක ගේ උපදෙස් සහ මෙහෙයවීම අනුව ය. එයට කීවේ 'වියත් මග' කියා ය. ඔවුන්ගේ තර්කය වුයේ බදු අඩු කළ විට ආර්ථිකය වේගවත් ලෙස වර්ධනය වන්නේ ය යන්න යි. නමුත් එය එසේ සිදු වුයේ නැත. අනෙක් අතට එවැනි දිරි ගැන්වීම් දීමට හැකියාවක් මෙරට ආර්ථිකයට ඒ මොහොතේ තිබුණේ නැත.

## කොරෝනා වසංගතය මහ ව්‍යසනයක් කර ගැනීම

කොරෝනා වසංගත තත්ත්වය ස්වභාවික ව්‍යසනයකි. එසේ වුව ද, ශ්‍රී ලංකාව එයට මුහුණ දුන් ආකාරයෙන් වසංගතය මහ ව්‍යසනයක් බවට පත්කර ගැනීමක් සිදු වී ය.

බොහෝ රටවල් එයට මුහුණ දුන්නේ යථාර්ථය තේරුම් ගනිමින් සහ ආර්ථික ක්‍රියා කාරීත්වය ද හැකිතාක් දුරට පවත්වාගෙන යමින් ය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බලයේ සිටි දේශපාලනඥයින් පිරිසකට අවශ්‍ය වුයේ කොරෝනා ඉක්මනින් මැඩ ලකුණු දා ගැනීමට ය. රටේ දිස්ත්‍රික්ක කිහිපයකින් පමණක් රෝගීන් වාර්තා වෙද්දී මුළු රටම වසා තැබුවේ ය. එයින් සිදු වුයේ ආර්ථිකය සියයට 16 කින් පසු බැසීම යි.

රෝගී මරණ දෙක තුන වාර්තා වන විට රට ම වසා තැබුව ද, පසුව මරණ දහස් ගණනින් වාර්තා වෙද්දී එසේ කරන්නට හැකි වුයේ නැත. හිටපු සෞඛ්‍ය ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ප්‍රකාශ කළේ මුල දී අපට වැරදුන බව යි.

නමුත් ඒ වන විට ආර්ථිකයට විනාශය සිදු වී හමාර ය.

## තදියම් කාබනික වගාවේ විනාශය

කිසිදු විද්‍යාත්මක කරුණු සොයා බැලීමකින් තොරව මෙරට කෘෂිකර්මය එකවර කාබනික වගාවට හැරවීමේ විපාක ගැන අමුතුවෙන් කිව යුතු නැත. එය සම්පූර්ණ අප්‍රායෝගික, අසාර්ථක විනාශයක් වූ බව පසුව කාටත් ප්‍රත්‍යක්ෂ වී ය.

කරුණු තේරුම් ගන්නා විට කෘෂිකාර්මික නිෂ්පාදනය බිඳ වැටී තිබිණි. එක් පැත්තකින් සහල් සහ එළවළු වගාවත්, තවත් පැත්තකින් තේ වගාවත් මෙහි බරපතළ විනාශයට මුහුණ දුන්නේ ය.

ආර්ථිකයේ බිඳ වැටීම වේගවත් වීමට එය ප්‍රධාන හේතුවක් වූ බවට සැකයක් නැත.

## මුදල් නෝට්ටු මුද්‍රණය

රජයේ බදු ආදායම් අහිමි කරගත් ආණ්ඩුව වියදම් පියවා ගත්තේ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමෙනි. එනම්, වෙළෙඳපොළට මුදල් සැපයුම වැඩි කිරීමෙනි.

මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම ලෙස හඳුන්වනු ලැබුව ද මෙහි දී භෞතික වශයෙන් නෝට්ටු මුද්‍රණය කිරීමක් සිදුවන්නේ නැත. ඇත්ත වශයෙන් සිදුවන්නේ ගිණුම්කරණ කටයුත්තක් තුළින් වෙළෙඳපොළේ මුදල් සැපයුම වැඩි කිරීම යි.

රටේ භාණ්ඩ සහ සේවා නිෂ්පාදනයේ වැඩි වීමක් නොමැතිව මෙලෙස මුදල් සැපයුම වැඩි කළ විට සිදුවන්නේ මුදලේ සත්‍ය වටිනාකම අඩු වීම යි. එමගින් උද්ධමනය වැඩි වන අතර බඩු මිල ඉහළ යාම සිදුවෙයි. නමුත් මෙය එකවර සිදුවන්නේ නැත. මුදල් නිකුත් කිරීමේ බලපෑම ආර්ථිකයට සම්පූර්ණයෙන් දැනෙන්නේ යම් කලක් ගතවීමෙන් පසුව බව කියති. මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා කීවේ 2022 වසරේ රටේ උද්ධමනය සියයට 70 දක්වා ඉහළ ගියේ කලින් ක්‍රියාත්මක කළ මුදල් සැපයුමේ ප්‍රතිඵල වශයෙන් බව යි.

එසේ වුව ද, මුදල් සැපයුම වැඩි කිරීමේ බලපෑම 2020, 2021 වසරවල දී ද ආර්ථිකයට දැනෙන්නට පටන්ගෙන තිබිණි. රුපියල අවප්‍රමාණ වීමෙන් එම තත්ත්වය ප්‍රකාශයට පත්වෙමින් තිබිණි. ආර්ථිකය බිඳ වැටීමක් කරා ගමන් කිරීමට මෙම මුදල් සැපයුම ද විශාල ලෙස දායක වී ය.

## රුපියල රැක ගැනීමට ඩොලර් නාස්ති කිරීම

අසීමිත ලෙස මුදල් අච්චු ගැසීම නිසා රුපියලේ අගය පහළ බසින විට මහ බැංකුව කළේ එය රැක ගැනීම සඳහා ඒ වන විට මහ බැංකුව සතුව තිබූ ඩොලර් සංචිත වෙළෙඳපොළට නිකුත් කිරීම යි. එමගින් උත්සාහ කළේ රුපියලේ හුවමාරු අගය අඩු වීමෙන් සිදුවන ආර්ථික ප්‍රශ්න අවම කර ගැනීම යි.

2019 වන විට මහ බැංකුව සතුව තිබූ ඩොලර් සංචිතය මිලියන 7,500 ක් හෙවත් බිලියන 7.5 ක් පමණ වී ය. 2022 වසරේ ආරම්භය වන විට එය මිලියන සියයකට අඩු තත්ත්වයට වැටී තිබිණි. නිල සංචිතය ඩොලර් මිලියන 1500 ක් ලෙස ප්‍රකාශ කළ ද ඉන් මිලියන 1,400 ක් පමණ චීනයෙන් කොන්දේසි යටතේ ලබාගත්, ගනුදෙනු කළ නොහැකි අතමාරුවකි. එය යොදා ගත්තේ මහ බැංකුවේ සංචිත පිළිබඳ සැබෑ තත්ත්වය වසන් කිරීම සඳහා ය.

ඩොලරයේ අගය ස්ථාවර ලෙස පවත්වාගෙන යෑම වෙනුවෙන් එවකට ආණ්ඩුවේ ප්‍රබලයින්ව සිටි ඇතැම් දේශපාලනඥයින් දැඩි ලෙස පෙනී සිටිනු ද දක්නට ලැබිණි. ඒ සඳහා නොයෙක් තර්ක විතර්ක ද ඉදිරිපත් කරනු ලැබී ය. එය පෙන්වා දෙන ලද්දේ ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාත්මක කළ යුතු වැදගත් ප්‍රතිපත්තියක් වශයෙනි.

කෙසේ වෙතත්, කුමන තර්ක ඉදිරිපත් කළත්, අවසානයේ සිදු වූ දේ දැන් කවුරුත් දනිති. එයින් සිදු වුයේ ආර්ථික කඩාවැටීම වේගවත් වීම යි.

රුපියල රැක ගැනීමට ඩොලර් සංචිත විනාශ කර ගනිද්දී අනෙක් අතට සිදු වුයේ රටට ලැබෙන ඩොලර් ප්‍රමාණය ද අඩු වීම යි. විදේශ ප්‍රේෂණ ලෙස 2021 මුල දී මසකට ලැබුණු ඩොලර් මිලියන 700 ක පමණ මුදල 2022 මුල දී මසකට ඩොලර් මිලියන 250 ක් පමණ දක්වා පහත වැටී තිබිණි. ඩොලර් සඳහා නියම වටිනාකම නොගෙවා කෘත්‍රිම ලෙස අඩු මිලක් පවත්වාගෙන යෑම එම තත්ත්වය ඇතිවීමට හේතු වී ය.

අවසානයේ සිදු වුයේ මෙරටට අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වීමට අවශ්‍ය මුදල් නොමැති තත්ත්වයකට රට ඇද වැටීම යි.

මුලින් වාර්තා වුයේ වරායට පැමිණි නැව්වල භාණ්ඩ සඳහා ගෙවීම් කළ නොහැකිව ඒවා පෝලිම්වල රඳවා ඇති බව යි. රටට කිරිපිටි ගෙන්වීමට මුදල් නැති වීමෙන් කිරිපිටි පෝලිම් ආරම්භ වී ය. ගෑස් පෝලිම්, ඉන්ධන පෝලිම් ලෙස ප්‍රශ්නය වර්ධනය වූ අතර එම භාණ්ඩ ලැබෙන තෙක් දින ගණන් පෝලිම්වල රැඳී සිටින්නට ජනතාවට සිදු වී ය. පෝලිම්වල සිදු වූ මරණ ගැන ද වාර්තා වී ය.

විදුලිය නිපදවීමට ඛනිජ තෙල්, ගල් අඟුරු මිල දී ගැනීම දුෂ්කර වීමත් සමග විදුලිය කැපීමට සිදුවිය. වරෙක එය දිනකට පැය 13 ක් දක්වා වර්ධනය වී ය. විදුලිය කැපීම, කුඩා ආපන ශාලා හිමියා, කඩ හිමියා දක්වා සියලු දෙනාගේ ජීවනෝපායට බලපෑමක් වූ අතර එමගින් ආර්ථිකය තව තවත් කඩා වැටීම සිදු වී ය.

මෙරට දේශපාලනයේ පෙරළියක් දක්වා වර්ධනය වූ දේශපාලන අර්බුදයට හේතු වුයේ ආර්ථිකයේ එම කඩා වැටීම යි.

## ආර්ථික කඩාවැටීමේ පාඩම

ඉහතින් අප සාකච්ඡා කළේ ආර්ථික අර්බුදය ආර්ථික කඩා වැටීමක් දක්වා වර්ධනය වීමේ ප්‍රධාන සහ ආසන්න හේතු පිළිබඳව ය. එසේ වුවත්, මෙය ආර්ථික අර්බුදය වර්ධනය කළ හේතු මිස අර්බුදයේ ව්‍යුහාත්මක මූලය හෝ මූලයන් නොවන බව අවබෝධ කරගැනීම අවශ්‍ය ය. එම ව්‍යුහාත්මක මූලයන් ගැන වෙන ම සාකච්ඡා කළ යුතු ය.

කෙසේ වෙතත්, ඉහත කී ක්‍රියාමාර්ග ක්‍රියාවට නැගූ පාලකයින් සහ ඔවුන්ට උපදෙස් දුන් ඊනියා බුද්ධිමතුන් ආර්ථික අර්බුදයක් ඇති බව වත් තේරුම් ගෙන සිටියා ද යන්න ප්‍රශ්නයකි. එය ප්‍රශ්නයක් වන්නේ ඔවුන්ගේ ක්‍රියා මගින් ආර්ථික අර්බුදය විනාශයක් කරා ගෙන ගිය හෙයිනි.

එයින් තේරුම් ගත යුතු කාරණයක් වන්නේ තමන් 'සියල්ල දත්' ලෙස සිතා සිටින දේශපාලනඥයින්ගේ හෝ බුද්ධිමතුන්ගේ හෝ ඊනියා සංකල්ප ආර්ථිකයක් තුළ අත්හදා බලන්නට යෑම බරපතළ අවදානම් සහිත ක්‍රියාවක් බව යි. ආර්ථිකයක් මෙහෙයවිය යුත්තේ ඒ පිළිබඳව සැබෑ අවබෝධයක් ඇතිව බව මෙයින් උගත යුතු පාඩමකි. එය කරන්නේ කෙසේ ද යන්න ගැඹුරින් සාකච්ඡා කළ යුතු කාරණයකි.

මේ සියල්ලට අපගේ සමාජයේ පැවති ඇතැම් ආකල්ප ද හේතු වූ බව පැහැදිලි කාරණයකි. ජනතාව රජයෙන් බලාපොරොත්තු වුයේ සහන ලබා දීම යි. බඩු මිලට, විදුලි ගාස්තුවට, ජල ගාස්තුවට, කෘෂිකර්මයට, කර්මාන්තවලට ආදී සියල්ලට සහනාධාර දීමේ හැකියාවක් රජයට ඇතැයි ඔවුහු විශ්වාස කළහ. ඒ සියල්ලට අවසානයේ ගෙවන්නට වන්නේ තමන්ට ම ය යන අවබෝධය ඔවුන් තුළ දක්නට නොලැබිණි. එයින් සිදු වූ විශාල ව්‍යසනයකට පසුව ද තවමත් එම අදහස් මත බොහෝ දෙනා ක්‍රියා කරති.

රජයෙන් සහන ඉල්ලීම වෙනුවට ඉහළ ජීවන මට්ටමක් සහිතව ජනතාවට ජීවත්වීමට හැකි ආර්ථිකයක් ගොඩ නැගීම රජයේ කාර්යභාරය ලෙස තේරුම් ගැනීම දැන් අත්‍යවශ්‍ය කාරණයකි.

අපට 'සිස්ටම් චේන්ජ්' කිරීමේ හැකියාව ලැබෙන්නේ එම ආකල්පමය වෙනස ගොඩ නගාගත හැකි වුවහොත් පමණකි.

## පරිච්ඡේදය 2

# ආර්ථික අර්බුදයේ සංයුක්ත කොටස් දෙක සහ විසඳුම්

වත්මන් ආර්ථික අර්බුදය, එය වර්ධනය වීමට හේතු ආදී කරුණු පිළිබඳව එම ක්ෂේත්‍රයේ ප්‍රාමාණික දැනුමක් ඇති විද්වතුන් විසින් බොහෝ දේ ලියා ඇත. එය ඇතැම් විට සාමාන්‍ය ජනයාට පහසුවෙන් ග්‍රහණය කරගත නොහැකි තරම් සංකීර්ණ විවාද බවට ද පත්ව තිබේ. එමෙන් ම, මහජනයාට සරල ලෙස කරුණු තේරුම් කිරීමේ උත්සාහයන් ද දක්නට ලැබෙයි. ආර්ථික ප්‍රශ්න පිළිබඳව මීට පෙර කිසි දිනෙක නොතිබූ මට්ටමේ සංවාදයක් මේ වන විට සිදුවෙමින් පවතියි.

අන්තර්ජාලය පිළිබඳ සාකච්ඡාවක දී සිදු කොට තිබූ ප්‍රකාශයක් වත්මන් සංවාදයටත් වලංගු යැයි සිතේ. එම ප්‍රකාශය නම් අන්තර්ජාලයට පිවිසුණු විට අපට ලැබෙන්නේ අවශ්‍ය තරම් තොරතුරු නොව තොරතුරු ගංවතුරක් (Flood of information) බව යි. එවිට සිදු වන්නේ හොඳින් පීනන්නට දැන නොසිටියහොත් එම ගංවතුරේ අප ගසාගෙන යෑම යි.

ආර්ථික අර්බුදය පිළිබඳ අද තිබෙන සංවාදයට ද එම කියමන තරමක් දුරට වලංගු විය හැකි ය.

දැන් අවශ්‍ය වන්නේ මෙම ගංවතුරට හසු නොවී තත්ත්වය අවබෝධ කර ගැනීමේ උත්සාහයකි. එනම් ප්‍රශ්නයේ හරය සරල ලෙස ග්‍රහණය කර ගැනීමේ උත්සාහයකි.

මෙම සමාලෝචනය සකස් වන්නේ එබඳු උත්සාහයක් වශයෙනි. එහි දී, මෙතෙක් මෙම සංවාදය තුළ ප්‍රකාශ වූ ප්‍රබල අදහස් සරල ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහ දරනු ඇත.

## ද්විත්ව හිඟයයන්

ආර්ථික අර්බුදය ගැන කරුණු දක්වන විද්වතුන් හිඟයයන් දෙකක් ගැන කරුණු ඉදිරිපත් කොට ඇත. ඉන් පළමුවැන්න හඳුන්වනු ලබන්නේ ප්‍රාථමික ගිණුමේ හිඟය වශයෙනි. දෙවැන්න ජංගම ගිණුමේ හිඟය ලෙස හඳුන්වනු ලබයි. මෙම හිඟයයන් දෙක ම හෝ ඉන් එකක් ආර්ථිකයක යම් මොහොතක පැවතිය හැකි ය. එවිට එයට විසඳුම් සෙවීම අවශ්‍ය ය. විසඳුම් නොදී දිගු කලක් පැවතීම අර්බුදයක් කරා වර්ධනය වීමට හේතුවක් විය හැකි ය.

## ප්‍රාථමික ගිණුම

ප්‍රාථමික ගිණුම ලෙස හඳුන්වනු ලබන්නේ යම් වසරක් තුළ රජයේ ආදායම් සහ වියදම් අතර වෙනස පෙන්වන ගිණුම යි. එනම්, එම වසර තුළ රජය කළ හෝ කරන වියදම් පියවාගැනීමට ප්‍රමාණවත් ආදායමක් ලැබෙන්නේ ද එහි අතිරික්තයක් හෝ හිඟයක් හෝ පවතින්නේ ද යන කාරණය යි.

සාමාන්‍යයෙන් රජයක වාර්ෂික ආදායම් සහ වියදම් පෙන්නුම් කරන්නේ වාර්ෂික අයවැය ලේඛනය මගින් ය. ආදායම් සහ වියදම් ඉලක්ක ඒ ආකාරයෙන් පවත්වාගෙන ගොස් තිබේ ද වෙනස්කම් මොනවා දයන කරුණු වර්ෂය අවසානයේ කරන ගණන් බැලීම් මගින් හඳුනාගත හැකි ය. බොහෝ විට එය සිදුවන්නේ ඊළඟ වර්ෂයේ අයවැය ඉදිරිපත් කිරීමත් සමග ය.

මෙහි දී සාමාන්‍ය ජනයා නිතර ම සිතන්නේ සහ ඇතැම් ආර්ථික විද්‍යාඥයින් ද අනුමත කරන්නේ අයවැය තුලනය කිරීම ඉතා වැදගත් බව යි. එනම් වියදම් කරන ප්‍රමාණයට මුදල් ඉපයීම සහතික කළ යුතු බව යි.

එසේ වුව ද, මීට වඩා වෙනස් අදහස් දරන ආර්ථික විද්‍යාඥයින් සිටින බව ද අප දැනගත යුතු කරුණකි. එම පිරිසගේ මතය වන්නේ රජය තම ආදායම් ඉක්මවා වියදම් කිරීමෙන් ආර්ථිකය සංවර්ධනය කළ හැකි බව යි. කලක් එම අදහස ආර්ථික විද්‍යාඥයින් අතර අධිපති මතවාදය වශයෙන් ද පැවතිනි.

මෙම මතය නිසා විශේෂයෙන් තුන්වන ලෝකයේ රටවල අයවැය නොපියවා තැබීම, එසේත් නැතහොත් ණය වී අයවැය පියවීම සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව තිබිණි. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඉදිරිපත් වූ අයවැය වැඩි ගණනක මෙම තත්ත්වය පැවති බව පැහැදිලි කරුණකි.

ඒ අප කතා කළේ අයවැය සහ අයවැය හිඟය පිළිබඳව ය. නමුත් ප්‍රාථමික ගිණුම ලෙස හඳුනාගන්නේ රජයේ සමස්ත අයවැය නොවේ. එහි කොටසකි.

ප්‍රාථමික ගිණුම මගින් සලකා බලන්නේ වසරට ඍජු ලෙස අදාළ ආදායම් සහ වියදම් ප්‍රමාණය යි. ආදායම් වශයෙන් රජයට ලැබෙන සමස්ත ආදායම සැලකිල්ලට ගන්නා නමුත් වියදම් පැත්තේ දී සැලකිල්ලට ගන්නේ වසර තුළ කරන්නට තිබෙන ණය වාරික ගෙවීම් සහ පොළී ගෙවීම් අතහැර ඉතිරි වියදම් ප්‍රමාණය යි.

ණය සහ පොළී යනු පෙර වසරවල කළ වියදම් පියවා ගැනීම සඳහා කරන ගෙවීමකි. ප්‍රාථමික ගිණුමේ දී එම කොටස අතහැර ගණන් බලන්නේ එම නිසා විය හැකි ය.

එම ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවතින්නේ නම් එහි තෙරුම වන්නේ එම වසරේ වියදම් පියවාගත් පසුව රජයට මුදලක් වෙනත් කටයුතු සඳහා ඉතිරි වන බව යි. ප්‍රාථමික ගිණුමේ හිඟයක් පවතින්නේ නම් එම වසරේ වියදම් පියවා ගැනීමට ණය ගැනීමට රජයට සිදුවෙයි. එය දිගින් දිගට සිදුවන්නේ නම් රජයට සිදුවන්නේ දිගින් දිගට ණය ගැනීමට ය. ණය උගුලක් නිර්මාණය වන්නේ ඒ ආකාරයෙනි.

ශ්‍රී ලංකාවේ අයවැය තුළ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා වී ඇත්තේ වසර හයක දී පමණක් ලෙස වාර්තා වී ඇත. 1954, 1955, වසරවල පැවති අතිරික්තයෙන් පසු යළි එවැන්නක් වාර්තා වී ඇත්තේ 1977 දී ය. ඉන් පසු 2017 දී සහ 2018 දී ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා වී තිබේ. ආර්ථික අර්බුදයට මුහුණ දෙමින් 2023 වසරේ දී යළිත් අතිරික්තයක් වාර්තා කිරීමට අප රටට හැකි වී තිබේ.

කෙසේ වෙතත්, ප්‍රශ්නය වන්නේ නිදහසින් පසු ගත වූ වසර 76 ක කාලයෙන් වසර 70 ක් ම අපරටේ පවත්වාගෙන ගොස් තිබෙන්නේ ප්‍රාථමික ගිණුමේ හිඟය සහිත අයවැය ලේඛන වීම යි. එය ණය මගින් පියවමින් දිගට පවත්වාගෙන යා හැකිව තිබූ නිසා කිසිවෙකු එය බරපතළ ප්‍රශ්නයක් ලෙස සැලකුවේ නැත. එලෙස ණය වීමේ වරදක් නැති බව කියන ආර්ථික විද්‍යා මතවාදයක් ද තිබූ බව ද අමතක කළ යුතු නැත.

සිංගප්පූරුව වැනි රටවල් සංවර්ධනය වන විට අනුගමනය කළේ මීට සම්පූර්ණයෙන් ම වෙනස් ප්‍රතිපත්තියකි. එරට හිටපු මුදල් ඇමතිවරයකු වූ ගෝ කෙන් ස්වි (Goh Keng Swee) නිතරම ඉදිරිපත් කළේ අයවැය අතිරික්තයක් සහිත අයවැය ලේඛන ය. එරට සිටි වෙනත් මුදල් ඇමතිවරු ද ගෝ කෙන් ගේ එම ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන ගියෝය.

ශ්‍රී ලංකාවේ තත්ත්වය වුයේ මුදල් ඇමතිවරුන් කිහිපදෙනෙකු හැරුණු විට අන් සියලු දෙනා ප්‍රාථමික ගිණුමේ හිඟයක් ඇතිවන ලෙස අයවැය පවත්වාගෙන යාමට කටයුතු කිරීම යි. එනම්, අයවැය පියවීමට ණය ලබාගත යුතු තත්ත්වයක් පවත්වාගෙන යෑම යි.

මෙය හුදෙක් මුදල් ඇමතිවරුන්ගේ හෝ ආණ්ඩුවල වරදක් ලෙස සැලකීම ද වරදකි. මෙරට ජනතාව බොහෝ අංශවලින් රජයේ සහන බලාපොරොත්තු වී ය. ආණ්ඩු, බලයට ආවේ සහ බලයේ රැඳී සිටියේ ජනතාවගේ එම ඉල්ලීම් ඉටු කරන බවට පොරොන්දු වෙමිනි. එමෙන් ම, ඇතැම් දේශපාලඥයින් ද කළේ ජනතාවට ආකර්ශනීය විවිධ සහන පොරොන්දු වෙමින් දේශපාලන බලය ලබා ගැනීමට උත්සාහ දැරීම යි. එබැවින් සියල්ල කළ නොහැකි වුවත්, එම ජනතා ඉල්ලීම් සහ දුන් පොරොන්දු උපරිම ලෙස ඉටු කළ යුතුව තිබිණි. ඒ සියලු වියදම් ඇතුළත් වූ විට අයවැය හිඟයක් පැවතීම අනිවාර්ය වී ය. ප්‍රාථමික ගිණුමේ හිඟයක් දිගට ම පැවතීමට මෙම තත්ත්වය ප්‍රබල හේතුවකි.

කොටින් කිවහොත් දිගු කලක් තිස්සේ අප සිදුකොට තිබෙන්නේ ණයට කමින් ජීවත් වීම යි. ණය ගැනීමේ හැකියාව තිබෙන තාක් එය ප්‍රශ්නයක් ලෙස කිසිවකු හඳුනාගත්තේ නැත.

එය බරපතළ ප්‍රශ්නයක් වුයේ ණය කන්දක් ගොඩ ගැසී තවදුරටත් ණය ගත නොහැකි තත්ත්වයකට රට පත්වීම හේතුවෙනි.

මෙලෙස ප්‍රාථමික ගිණුමේ හිඟයක් දිගට ම පවත්වාගෙන යෑම ආර්ථික අර්බුදයේ සංයුක්ත කොටසකි.

## ජංගම ගිණුමේ හිඟය හෙවත් ගෙවුම් ශේෂ ප්‍රශ්නය

මෙතෙක් අප කතා කළ ප්‍රාථමික ගිණුමේ හිඟය පිළිබඳ ප්‍රශ්නය රජයේ වියදම් පිළිබඳ ප්‍රශ්නය කි. ජංගම ගිණුමේ ප්‍රශ්නය රජයේ ආදායම් වියදම් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එය රටේ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රශ්නයකි.

ජංගම ගිණුමේ අය පාර්ශවය වන්නේ අපගේ අපනයන මගින් සහ වෙනත් මාර්ගවලින් රටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය යි. එනම් ප්‍රධාන වශයෙන් විදේශ ගනුදෙනුවලින් අප උපයා ගන්නා මුදල් ප්‍රමාණය යි. සරලව කිව හොත් රටට ලැබෙන ඩොලර් ප්‍රමාණය යි.

මෙහි වැය පාර්ශ්වය වන්නේ විදේශවලින් අප කරන ආනයන සඳහා වන වියදම යි. අපගේ අත්‍යවශ්‍ය ආහාර, ඖෂධ, ඉන්ධන ඇතුළු බොහෝ භාණ්ඩ

අපට විදේශවලින් ආනයනය කරන්නට සිදුවෙයි. ඒ සඳහා අපට විදේශ විනිමය හෙවත් ඩොලර් අවශ්‍ය වෙයි.

අපගේ ආනයන කිරීමට අවශ්‍ය තරම් විදේශ විනිමය ප්‍රමාණයක් අපගේ අපනයන මගින් නොලැබෙන විට එය අර්බුදයකට හේතු වෙයි. එම තත්ත්වය දිගට ම පවතින විට එය අර්බුදය දරුණු වීමට හේතුවක් වෙයි.

මෙලෙස අපගේ ආනයන සඳහා ප්‍රමාණවත් අපනයන ආදායමක් නොලැබීම ශ්‍රී ලංකාව දිගු කලක් තිස්සේ මුහුණ දුන් ගැටලුවකි.

ශ්‍රී ලංකාව නිදහස ලබන විට මෙරට ප්‍රධාන ආනයන භාණ්ඩයක් වී තිබුණේ සහල් ය. රටට අවශ්‍ය සහල් ප්‍රමාණයෙන් සියයට 85ක් පමණ පිටරටින් ආනයනය කරන්නට සිදු වී තිබිණි. ඒ සඳහා එවකට තිබුණු ප්‍රධාන අපනයන වන තේ, රබර්, පොල් අපනයනයෙන් ලැබුණු විදේශ විනිමය ප්‍රමාණවත් නොවී ය.

ගොවි ජනපද පිහිටුවමින් කෘෂිකර්මය වර්ධනය කිරීම, කෘෂි පර්යේෂණ මගින් වැඩි ඵලදා සහිත බීජ හඳුන්වා දීම වැනි වැඩ සටහන් ක්‍රියාවට නංවන ලද්දේ එම ප්‍රශ්නයට විසඳුම් වශයෙනි. හරිත විප්ලවය මගින් කෘෂි නවීකරණයට පියවර ගැනිණි.

ඒ අතර එම කාලයේ සහල් ආනයනය සඳහා චීනය සමග සහල් - රබර් ගිවිසුමක් ද අත්සන් කොට ක්‍රියාත්මක කළේ ය.

පසු කාලයේ සහල් ප්‍රශ්නයට සාර්ථක විසඳුමක් වුයේ මහවැලි ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාවට නැංවීම යි.

ගෙවුම් ශේෂ ප්‍රශ්නයට එකල තිබු එක් විසඳුමක් නම් ආනයන විශාල ලෙස සීමා කිරීම යි. හැකි සෑම දෙයක් ම දේශීය වශයෙන් නිපදවීම එකල පිළිගත් ප්‍රතිපත්තිය වී ය.

විදෙස් ගතවීමට හෝ විදෙස් අධ්‍යාපනයට හෝ විදේශ විනිමය නිකුත් කිරීමට සීමා පනවා තිබිණි. විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයක් ද ක්‍රියාත්මක වී ය.

ඒ සියල්ල කළ ද ජංගම ගිණුමේ හිඟය හෙවත් ගෙවුම් ශේෂ ප්‍රශ්නවලට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු වී ය.

එම අවස්ථාවල මෙරටට සිදුවුයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය පතන්නට ය. මීට පෙර 16 වතාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ සටහන් මෙරට ක්‍රියාත්මක වුයේ මෙම හේතුව නිසා ය.

එකල ශ්‍රී ලංකාව මෙන් ම තුන්වන ලෝකයේ බොහෝ රටවල් කල්පනා කළේ ගෙවුම් ශේෂ ප්‍රශ්නයට හොඳම විසඳුම සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම බව යි. එමගින් ආනයන සීමා කිරීම එක ම විසඳුම බව යි.

එසේ වුවත්, කල් යෑමේ දී පෙනී ගියේ එම ප්‍රතිපත්තිය අසාර්ථක බව යි. ලෝකයේ අත්දැකීම වුයේ සංවෘත ආර්ථික ක්‍රම පවත්වාගෙන ගිය රටවල් ආර්ථික වශයෙන් එකතැන පල්වෙද්දී ආර්ථිකය විවෘත කළ ජපානය, සිංගප්පූරුව, තායිවානය වැනි රටවල් ආර්ථික වශයෙන් වේගවත් සංවර්ධනයක් ලබාගත් බව යි.

කලින් සංවෘත ආර්ථික ක්‍රම ක්‍රියාත්මක කළ ශ්‍රී ලංකාව මෙන් ම, ඉන්දියාව, චීනය, වියට්නාමය වැනි රටවල් ද විවෘත ආර්ථික ක්‍රම ක්‍රියාත්මක කිරීමට පෙළඹෙන්නේ එම අත්දැකීම නිසා ය.

නමුත් දැන් තත්ත්වය නම් ආර්ථිකය විවෘත කළ අනෙක් බොහෝ රටවල් ජංගම ගිණුමේ ප්‍රශ්න නැතහොත් ගෙවුම් ශේෂ ප්‍රශ්න විසඳාගෙන ඇතත්, ශ්‍රී ලංකාව දිගට ම එම ප්‍රශ්නයට මුහුණ දීම යි.

ආර්ථික විද්‍යාඥයින්ගේ මතය වී ඇත්තේ ශ්‍රී ලංකාව ආර්ථිකය අවශ්‍ය තරම් විවෘත නොකළ බව සහ අවශ්‍ය ප්‍රතිසංස්කරණ නොකළ බව යි. මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා මෑතක දී ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව විවෘත ආර්ථිකයක් ඇති රටක් නොවන බව යි.

විදේශ විනිමය ප්‍රශ්නයට පිළිතුර ලෙස ආනයන සීමා කිරීමේ විසඳුම තව දුරටත් වලංගු නැත. දැන් පිළිගත් විසඳුම වන්නේ අපනයන ඉහළ දමා ගැනීම යි. ශ්‍රී ලංකාවට තවමත් එම ඉලක්කය කරා යාමට නොහැකි වී තිබේ.

අපගේ ආනයන ලබා ගැනීමට තරම් අපනයන ආදායමක් නොලබන විට ද නැවතත් කරන්නේ කුමන හෝ ආකාරයකින් විදේශ ණය ගැනීමෙන් එම හිඟය පියවා ගැනීම යි. එය දිගින් දිගට කරන විට සිදුවන්නේ ගෙවාගත නොහැකි ණය කන්දක් ගොඩ ගැසීම යි.

එලෙස ජංගම ගිණුමේ හිඟය ආර්ථික අර්බුදයේ අනෙක් සංයුක්ත කොටස වෙයි. පසුගිය කාලයේ අපට දකින්නට ලැබුණේ එම අර්බුදය උත්සන්න වී රටට අවශ්‍ය ආනයන කළ නොහැකි තත්ත්වයට පත්වීම යි.


## ණය, සංවර්ධනයේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස

රාජ්‍ය ණය පිළිබඳව සාකච්ඡා කරන විට සාමාන්‍ය ජනයා අතර සමහරු ප්‍රශ්න කරන්නේ මෙතරම් ණය ගැනීම හරි ද යනුවෙනි. මේ ණය ගෙවා අවසන් කරන්නේ කවදා ද යනුවෙන් ද ප්‍රශ්න කරන උදවිය ද සිටිති.

නමුත් තේරුම් ගත යුතු වැදගත් කරුණක් වන්නේ ණය යනු සංවර්ධන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය සාධකයක් බව යි.

ලෝකයේ දියුණු ම රටවල් දෙස බලා ඔවුන්ගේ ණය ප්‍රමාණ සොයා බැලුවහොත් අපට පෙනෙන්නේ ඒ හැම රටක් ම විශාල ලෙස ණය වී සිටින බව යි. ලෝකයේ වෙනත් රටවලට ණය දෙන රටවල් ද විශාල ලෙස ණය වී තිබෙන ආකාරය සංඛ්‍යා ලේඛන මගින් පෙන්නුම් කරයි.

Public debt by country in 2022 (USD billion)




*Source:* UN Global Crisis Response Group calculations based on IMF World Economic Outlook (April 2023).

එක්සත් ජාතීන්ගේ වෙළෙඳ සහ සංවර්ධන සමුළුව හෙවත් අන්ක්ටාඩ් (UNCTAD) සංඛ්‍යා ලේඛන අනුව මේ වන විට ලෝකයේ වැඩි ම ණය ගැති රාජ්‍යය වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය යි. 2022 දී එක්සත් ජනපදයේ සමස්ත ණය ප්‍රමාණය ඩොලර් බිලියන 30,985 කි. දෙවැනි තැනට එන චීනයේ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 15,995 කි. ජපානය ණය වී ඇති ප්‍රමාණය ඩොලර් බිලියන 11,051 කි. බ්‍රිතාන්‍යය ඩොලර් බිලියන 3,152ක්, ප්‍රංශය බිලියන 3,072ක්, ජර්මනිය බිලියන 2,711 ක් සහ ඉතාලිය බිලියන 2,911ක් ලෙස ණය වී ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංඛ්‍යා ලේඛන අනුව ජපානය තම දළ දේශීය නිෂ්පාදිතය මෙන් සියයට 214.27 ක ප්‍රමාණයක් ණය වී ඇත. ඉතාලියේ එම සංඛ්‍යාව සියයට 140.57 කි. ඇමෙරිකා එක්සත් ජනපදය තම දළ දේශීය නිෂ්පාදනය මෙන් සියයට 110.15ක් ණය වී ඇති අතර බ්‍රිතාන්‍යයේ එම සංඛ්‍යාව 100.75ක් ද, ප්‍රංශයේ 92.15ක් ද වෙයි.

සංවර්ධනයේ ආදර්ශයක් ලෙස අප කතා කරන සිංගප්පූරුවේ රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතය මෙන් සියයට 135.86 කි.

මෙයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය 100%ට මඳක් වැඩි අගයක පවතී.

මෙයින් පෙනී යන්නේ ණය යනු සංවර්ධනය සමග එකට පවතින අත්‍යවශ්‍ය සාධකයක් බව යි. මෙම රටවල් ධනවත් වන විට අනෙක් පසින් සිදුව තිබෙන්නේ ණය ගැති භාවය ද වර්ධනය වීම යි.

මෙම කරුණ තේරුම් ගැනීමට දේශපාලන ආර්ථික විද්‍යාවේ සංකල්ප භාවිත කළ යුතුව ඇත. එය වෙන ම අභ්‍යාසයකි. එසේ වුවත්, මෙහි දී තේරුම් ගත යුතු කරුණ වන්නේ ණය යනු සංවර්ධනයේ අත්‍යවශ්‍ය සාධකයක් බව යි.

මෙය තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ සංවර්ධනය සඳහා ණය ගැනීම සහ ණය අර්බුද ඇතිවන ලෙස ණය ගැනීම අතර වෙනස හඳුනා ගැනීම සඳහා ය. එමෙන් ම ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඉන් පසුව ද ණය ගැනීම අවශ්‍ය වීමේ කාරණය මෙන් ම, එලෙස ණය ගැනීමේ දී එය ඵලදායී ආකාරයෙන් සිදු කිරීම ගැන ද එමගින් අදහසක් ඇතිකර ගත හැකි වෙයි.

ඉහත කී ධනවත් රටවල් ඔවුන්ගේ ණය ගෙවා අවසන් කරන්නේ කවදා ද කෙසේ ද කියා ප්‍රශ්නයක් කෙනෙකුට විමසිය හැකි ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඇතැම් පිරිස් දැනටමත් මෙම ප්‍රශ්නය මතුකරන බව පෙනෙන්නට තිබේ.

ඉහත ප්‍රශ්නයට පිළිතුර වන්නේ වත්මන් ආර්ථික ක්‍රමය සහ සංවර්ධන ක්‍රියාවලිය තුළ කිසිදු රටක් ණය ගෙවා අවසන් කරන්නට කල්පනා නොකරන බව යි. ඔවුන් කල්පනා කරන්නේ ණය පවත්වාගෙන යෑම සම්බන්ධයෙනි. ණය සේවා කරණය ලෙස හඳුන්වන එහි දී අවධානය යොමු කරන්නේ ණය වාරික සහ පොළී ගෙවමින් ණය පවත්වාගෙන යෑම යි. ඒ අතර ඇතැම් ණය ගෙවා අවසන් වන අතර අලුතින් ණය ගැනීම ද සිදු වනු ඇත.

මෙම සංවර්ධන ක්‍රියාවලියේ දී ණය ඉටුකරන තීරණාත්මක කාර්යභාරය ලෝකයේ ප්‍රධාන රටවල් සහ ආර්ථික විද්‍යාඥයින් තේරුම් ගත්තේ මීට බොහෝ කලකට පෙර දී ය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ජාත්‍යන්තර මුල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතන පද්ධතියක් ඇති කරන්නේ ලෝකයේ සියලු රටවල ණය අවශ්‍යතා සැලකිල්ලට ගෙන එම ප්‍රශ්නවලට විසඳුම් දීම සඳහා ය. මේ වන විට ඒ සඳහා ආයතන විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක ය.

ජාත්‍යන්තර සංවිධාන ජාලයට අමතර වශයෙන් බොහෝ රටවල් තමන්ගේ ම ණය සහ ආධාර ව්‍යාපෘති ද ක්‍රියාත්මක කොට ඇත. ඒ සියල්ල ක්‍රියාත්මක වන්නේ සංවර්ධනය සඳහා ණය අවශ්‍යතාවය පිළිබඳ තිබෙන පොදු පිළිගැනීම හේතුවෙනි.

ධනය නිෂ්පාදනය වන්නේ ණය මගින් ය යන අදහස මුලින් ම ඉදිරිපත් කොට ඇත්තේ කාල් මාක්ස් විසිනි. ඔහු එය ඉදිරිපත් කළේ ධනවාදී නිෂ්පාදන මාදිලිය තුළ නිපදවෙන අතිරික්තය පැමිණෙන්නේ කොහෙන්ද යන ප්‍රශ්නයට පිළිතුරු සපයමින් ය. ඔහු ප්‍රශ්න කළේ ධනපතියා යොදවන ධනයට වැඩි මුදලක් අවසානයේ ඉවත් කර ගන්නේ කෙසේ ද යනුවෙනි. කාල් මාක්ස් පෙන්වා දුන්නේ එම අමතර මුදල ලැබෙන්නේ ණය ක්‍රමය මගින් බව යි. ණය සහ සංවර්ධනය පිළිබඳ දේශපාලන ආර්ථික විද්‍යා විශ්ලේෂණයක දී කාල් මාක්ස්ගේ එම අදහස ප්‍රවේශයක් ලෙස භාවිත කළ හැකි වනු ඇත.

කෙසේ වෙතත්, මෙහි දී මතක තබා ගත යුතු කරුණ වන්නේ අපගේ අරමුණ විය යුත්තේ ණය නැති රටක් බිහිකිරීම නොවන බව යි. එය අපට කිසිදාක කළ නොහැකි වනවා මෙන් ම එයට උත්සාහ දැරීම ද ආර්ථික සංවර්ධනයට හානිකර වෙයි.

අපගේ ඉලක්කය විය යුත්තේ ණය අර්බුදයක් නොවී පවත්වාගෙන යමින් රට සංවර්ධනය කිරීම යි.

ඒ සඳහා ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සමග එකඟ වූ ඉලක්ක දෙකක් අප ඉදිරියේ ඇත. එනම්, වාර්ෂික ණය ගැනීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට

4.5 කට සීමා කිරීම සහ සමස්ත ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 65 ක් නොඉක්මවන සේ පවත්වා ගැනීම යි.

ණය ගැන සහ ණය අර්බුදයක් වීම ගැන ඉහත කී කරුණු තේරුම් ගැනීම ආර්ථික අර්බුදයෙන් ගොඩ යෑම සඳහා මෙන් ම යළිත් අර්බුදයකට ගමන් නොකිරීම සඳහා අපට අතිශයින් වැදගත් වෙයි.

## ආර්ථික අර්බුදයේ අද අප කොතන ද?

2022 වසර මැද සිදු වූ දේශපාලන වෙනස්කම් වලින් පසු, කෙටි කලක දී , ඒ වන විට ආර්ථිකය කඩා වැටී තිබූ තත්ත්වයෙන් ගොඩ ගන්නට හැකි වූ බව රහසක් නොවේ. ඉන්ධන පෝලිම්, ගෑස් පෝලිම්, කිරිපිටි පෝලිම් අවසන් කරන්නට හැකි වී ය. නොකඩවා විදුලිය ලබා දීම ද සිදු විය. මෙරටට ආනයනය නතර කළ ඇතැම් භාණ්ඩ හැර අනෙක් භාණ්ඩ හිඟයකින් තොරව ලබාගත හැකි වී ය.

අධික උද්ධමනය නිසා බඩු මිල ඉහළ ගියේ ය. ඉන්ධන සහ විදුලිය සඳහා සහනාධාර ඉවත් කොට ඒවායේ වියදමට සරිලන ගාස්තු ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබී ය. එම ගාස්තු ද වැඩි වී ය.

රජයේ වියදම් පියවා ගැනීම සඳහා බදු වැඩි කිරීමට කටයුතු කළේ ය. වැට් බදු සියයට 15 දක්වා සහ පසුව සියයට 18 දක්වා ඉහළ දමනු ලැබී ය. ආදායම් බදු ඉහළ දැම්මේ විශාල විරෝධතා මධ්‍යයේ ය.

අනෙක් අතින් රජයේ වියදම් දැඩි ලෙස සීමා කරනු ලැබී ය. ඇතැම් ව්‍යාපෘති නවතා දමනු ලැබී ය. බඳවාගැනීම් නතර කෙරිණි. ප්‍රයෝජනවත් නොවන ලෙස පවත්වාගෙන ගිය රාජ්‍ය ආයතන වසා දැමීමට හෝ වෙනත් ආයතන සමග සම්බන්ධ කිරීමට කටයුතු කෙරිණි.

## ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක්

මෙබඳු ක්‍රියා මාර්ග රාශියක් මගින් 2023 වසරේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීමට හැකි වී තිබේ. එනම් රජයේ වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ලෙස ආදායම් ලබන්නට සමත් වී තිබේ.

ආර්ථික අර්බුදයේ සංයුක්ත කොටසක් වූ ප්‍රාථමික ගිණුමේ හිඟය පිළිබඳ ප්‍රශ්නය ඒ ආකාරයෙන් විසඳාගෙන ඇත.

එසේ වුව ද මෙය තාවකාලික විසඳුමකි. එයට හේතුව මෙම තත්ත්වය උදා කරගෙන ඇත්තේ රජයේ ඇතැම් වියදම් කපා හැරීමෙන් වීම යි. එම ඇතැම් වියදම් යළි ආරම්භ කිරීමට සිදු වෙයි. එවිට නැවත ප්‍රාථමික ගිණුමේ හිඟයක් ඇතිවීමට ඉඩ තිබේ.

මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා රජයේ ආදායම් වැඩි කර ගත යුතු ය. ඒ සඳහා බදු දැල පුළුල් කිරීම, බදු ගෙවිය යුතු නමුත් නොගෙවා මගහැර සිටින පිරිස් බදු දැලට කොටු කර ගැනීම ආදී බොහෝ ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

රජයේ ආදායම් වැඩි කර ගැනීමේ අනෙක් ක්‍රමය නම් ආර්ථිකය වර්ධනය කර ගැනීම යි. ආර්ථිකය වර්ධනය වන විට මහජනයාගේ ආදායම් ඉහළ යාමත් සමග බදු ආදායම ද වැඩි වෙයි.

කෙසේ වෙතත්, තවමත් අප සිටින්නේ යන්තම් ගැට ගසාගත් තත්ත්වයක ය. ප්‍රාථමික ගිණුමේ දැන් ලබාගෙන ඇති අතිරික්තය දිගට ම පවත්වාගෙන යෑමේ අභියෝගය අප ඉදිරියේ ඇත.

## ජංගම ගිණුමේ ප්‍රශ්නයට විසඳුම්

ආර්ථික අර්බුදයේ අනෙක් ප්‍රධාන ප්‍රශ්නය වූ ජංගම ගිණුමේ හිඟය හෙවත් ගෙවුම් ශේෂ ප්‍රශ්නය ද මේ වන විට තාවකාලික ලෙස විසඳාගෙන ඇත. එය කර ඇත්තේ ද සීමා කිරීම් රාශියක් සමග ය.

ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමට ආනයන සීමා කිරීම් රාශියක් ක්‍රියාත්මක කෙරිණි. ගිනුම් තත්ත්වය යහපත් වීමත් සමග බොහෝ සීමා මේ වන විට ඉවත් කොට තිබේ. එසේ වුවත්, වාහන ආනයනය වැනි ඇතැම් සීමා දිගට ම පවතියි.

අර්බුදයට පෙර මසකට ඩොලර් මිලියන 1,900 පමණ මට්ටමේ තිබූ අපගේ ආනයන වියදම මේ වන විට පවතින්නේ මිලියන 1,500 වැනි මට්ටමක ය.

යුරෝපයේ සහ ඇමෙරිකාවේ පවතින ආර්ථික පසුබෑස්ම සහ උද්ධමන තත්ත්වය නිසා ඇඟලුම් ඇතුළු අපගේ භාණ්ඩ අපනයන ක්ෂේත්‍රයේ පසුබෑස්මක් පවතියි

කෙසේ වෙතත් භාණ්ඩ අපනයනයෙන් ශ්‍රී ලංකාව ලබන ආදායම තවමත් ඩොලර් මිලියන 1,000 ක් ආසන්නයේ පවතියි. විදේශ ප්‍රේෂණ ලෙස ඩොලර් මිලියන 450 ක් පමණ සහ සංචාරක ව්‍යාපාරයෙන් මිලියන 250 ක් පමණ ද

ලැබෙමින් පවතියි. වෙනත් ඉපයීම් නොසලකා හැරිය ද ජංගම ගිණුමේ යම් අතිරික්තයක් මෙමගින් පෙන්නුම් කරයි.

මෙම තත්ත්වය තහවුරු වන්නේ පසුගිය මාස තුනක පමණ කාලය තුළ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වෙමින් ඩොලරයේ අගය පහත වැටෙමින් තිබීම මගින් ය.

එයින් පැහැදිලි වන්නේ ආර්ථික අර්බුදයට හේතු වූ කරුණක් වන ජංගම ගිණුමේ හිඟය පිළිබඳ ප්‍රශ්නයට ද මේ මොහොතේ තාවකාලික විසඳුම් ලැබී තිබෙන බව යි.

මෙයින් ඉදිරියට තිබෙන අභියෝගය වන්නේ රටේ අපනයන වර්ධනය කර ගනිමින් ස්ථාවර විදේශ විනිමය ආදායමක් සහතික කර ගැනීම යි. ඒ සඳහා යෝජිත නිදහස් වෙළෙඳ කලාප සංවර්ධනය, විදේශ ආයෝජන ප්‍රවර්ධනය ඇතුළු බොහෝ දේ කළ යුතුව ඇත.

## ණය ප්‍රතිව්‍යුහගත කරණය

ආර්ථික අර්බුදයේ සංයුක්ත කොටස් දෙක වන ද්විත්ව හිඟයට ඉහත කී ආකාරයේ විසඳුම් තාවකාලික ලෙස සපයාගෙන ඇතත්, ස්ථාවර ලෙස අර්බුදය විසඳීමට අභියෝග රැසක් ජයගත යුතුව ඇති බව ඉහත සඳහන් කරුණු අනුව පැහැදිලි විය යුතු ය.

එම අභියෝග ජය ගැනීමට ක්‍රියාකිරීම සඳහා අපට යම් හුස්ම ගැනීමේ ඉඩක් අවශ්‍ය ය. එය ලැබෙන්නේ ණය ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථක කර ගැනීමෙනි.

මෙහි දී දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරණය අවසන් කොට ඇත. එහි දී ඇතැම් පිරිස් විරෝධය ප්‍රකාශ කළේ එයින් අර්ථසාධක අරමුදලට අවාසියක් සිදු කළ බව කියමිනි. නමුත් දැන් පෙනෙන්නේ එමගින් අර්ථසාධක හිමියන්ට වාසි අත් වී ඇති බව යි.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී අර්ථ සාධක හිමියන්ට 2027 දක්වා සියයට 12 පොළියක් සහතික කළේ ය. ඉන්පසු කාලය සඳහා සහතික කළ පොළිය සියයට 9 කි.

මෙලෙස සහතික නොකළේ නම් පොළිය තීරණය වන්නේ භාණ්ඩාගාර බිල්පත් විකිණෙන පොළී අනුපාත අනුව ය. පසුගිය සතිය වන විට එම

පොළී අනුපාත සියයට දහයට පහළින් සටහන්ව තිබිණි. මහ බැංකුව කියන පරිදි උද්ධමනය සියයට පහක මට්ටමේ පවත්වාගෙන ගියහොත් ඉදිරියේ දී මෙම පොළී අනුපාත තව දුරටත් අඩු වනු ඇත.

එබැවින් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරණයේ දී ඉහළ පොළියක් සහතික කිරීමෙන් අර්ථසාධක අරමුදලේ ගිනුම් හිමියන්ට සිදු වී ඇත්තේ පාඩුවක් නොව වාසියකි.

විදේශීය ද්විපාර්ශවික ණය හිමියන් අතර ඉන්දියාව, ජපානය සහ පැරිස් සමාජයේ රටවල් එක් පාර්ශවයක් ලෙස ක්‍රියා කරනු පෙනෙන්නට ඇත. චීනය ක්‍රියා කරන්නේ වෙන ම පාර්ශවයක් වශයෙනි. කෙසේ වෙතත්, මෙම කණ්ඩායම් සමග ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය එකඟතාවක් මේ වන විට ගොඩ නැගී ඇත. එම එකඟතා නිශ්චිත ගිවිසුම් ලෙස මේ වන විට කෙටුම්පත් කරමින් සිටින බව වාර්තා වෙයි.

දැන් එකඟතාව අවශ්‍යව ඇත්තේ බහු පාර්ශවික ණය හිමියන් සමග ය. ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් මෙම කණ්ඩායම ලෙස ක්‍රියා කරයි. ඔවුන් සමග යෝජනා කිහිපයක් හුවමාරු වී ඇති අතර එම කටයුතු අවසන් අදියරට පැමිණ ඇති බව වාර්තා වී තිබේ.

ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කරන්නේ මැයි, ජූනි වන විට ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් කළ හැකි වන බව යි.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය දා පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී 2027 දක්වා සහන කාලයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බව යි. ඉන්පසු ණය ගෙවීමට 2042 දක්වා කාලය ලැබෙනු ඇතැයි ද ඒ මහතා කී ය.

ජනාධිපතිතුමා මෙබඳු ප්‍රකාශයක් කරන්නේ යම් පදනමක් ඇතිව බව ද තේරුම් ගැනීම වැදගත් ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වාසිය ලැබෙන්නේ ණය ගෙවීමට තවත් කාලය ලැබීමෙන් පමණක් නොවේ. රටට අලුතින් ණය සහ ආයෝජන ලබා ගැනීමට අවස්ථා විවර වීම ඒ සමග සිදුවෙයි. ණය නොගෙවන රටක් ලෙස දැන් තිබෙන පිළිගැනීම වෙනස් වීමත් සමග මෙම අවස්ථා ශ්‍රී ලංකාවට විවෘත වෙයි.

දැන් තිබෙන තත්ත්වය යටතේ අප රටට අලුතින් ණය දීමට කිසිදු රටකට හැකියාවක් නැත. ජපන් ආධාර යටතේ ක්‍රියාත්මක වීමට නියමිතව තිබී පසුගිය කාලයේ නවතා දැමූ ව්‍යාපෘති නැවත පටන්ගත හැක්කේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව බව ජපන් රජය ප්‍රකාශ කොට ඇත. මධ්‍යම අධිවේගී මාර්ග යේ එකඟ වී තිබූ ලෙස චීන සහ ජපන් ආධාර යටතේ වැඩ යළි ආරම්භ කිරීම සම්බන්ධයෙන් ද තත්ත්වය එය ම ය. තවත් ව්‍යාපෘති රැසක් සඳහා ආධාර සහ ආයෝජන ලබාගැනීමේ හැකියාව විවෘත වනු ඇතැයි අපේක්ෂිත ය.

එයින් පෙනී යන්නේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම යනු ආර්ථික අර්බුදයෙන් ඉවතට පැමිණීමේ තීරණාත්මක කඩඉමක් වන බව ය. මෙරට ආර්ථික සංවර්ධනයේ ගුණාත්මක පිම්මක් ඒ සමග සිදුවනු ඇත.

කෙසේ වෙතත්, ආර්ථිකයේ අභියෝග තවමත් ජයගෙන අවසන් නැත. සිදු වී තිබෙන්නේ ඒ සඳහා අවස්ථාව විවර වීම පමණකි. අර්බුදයෙන් ගොඩ පැමිණ රට සංවර්ධන මාවතට ප්‍රවිෂ්ට කළ හැක්කේ අභියෝග පිළිබඳව හොඳ අවබෝධයකින් යුතුව මේ පැමිණි මාවතේ ඉදිරියට ගමන් කළහොත් පමණකි.

වඩා දුෂ්කර කාලය අවසන් වෙමින් පවතියි. එළඹ තිබෙන්නේ පරිස්සමින් ඉදිරියට යා යුතු කාලය යි.

එය තේරුම් නොගෙන කටයුතු කළ හොත් නැවතත්, මහ විපතකට රට ඇද වැටීම ද සිදුවිය නොහැක්කක් නොවේ.

එවැනි විපතකට යළි ඉඩ නොතැබීම කාගේත් වගකීමක් වෙයි.

## පරිච්ඡේදය 3

# අර්බුදයෙන් මිදීමේ අභියෝගය

ආර්ථික අර්බුදය ආර්ථික කඩා වැටීමක් දක්වා වර්ධනය වූ විට ජනතාවගේ අවශ්‍යතා සැපයීමට නොහැකි වීම සහ පෝලිම් ඇතිවීම සිදුවිය. සාමාන්‍ය ජනයාට තම ජීවනෝපාය කරගත නොහැකි තත්ත්වයට පත් වී තිබිණි. දැන් ඒ තත්ත්වය වෙනස් වී තිබේ. මිල ඉහළ ගිය ද භාණ්ඩ හිඟයක් නැත. ජනතාවට තරමක් අමාරුකම් මැද වුව ද ජීවනෝපාය කරගෙන ජීවත් වීමේ අවස්ථාව සැලසී තිබේ.

ආර්ථිකය වර්ධනය වීමට පටන්ගෙන තිබේ. 2023 වසරේ අවසන් කාර්තුවේ වාර්තා වූ සියයට 4.5ක වර්ධනය බලාපොරොත්තු වුවාට වඩා ඉහළ තත්ත්වයකි.

ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වෙමින් ඩොලරයේ හුවමාරු අගය පහත වැටෙමින් පවතියි. ඉහළ ගිය බඩු මිල ද හෙමින් පහත වැටෙන බවක් පෙනෙන්නට තිබේ. 2024 දී උද්ධමනය ඉතා අඩු මට්ටමකට පැමිණ තිබේ.

නව ව්‍යාපෘති ඇරඹෙමින් තිබේ. ආයෝජන ද ලැබෙන්නට පටන් ගෙන ඇති බව වාර්තා වෙයි.

මේ සියල්ල මගින් පෙනෙන චිත්‍රය නම් ආර්ථික අර්බුදයෙන් රට ගොඩ යමින් සිටින බව සහ අනාගතය සුබදායී බව යි.

එසේ වුව ද ආර්ථික අර්බුදයේ සැබෑ හේතු සඳහා පිළියම් යෙදීම සහ සෞභාග්‍යවත් දේශයක් සඳහා අවශ්‍ය පදනම දැමීම මතුපිටින් පෙනෙනවාට වඩා දුෂ්කර සහ අභියෝගාත්මක කටයුතු බව තේරුම් ගත යුතුව ඇත.

## රජයේ වියදම් කළමනාකරණය

රජයේ ආදායම් සහ වියදම් පිළිබඳ වැදගත් ම කරුණ වන ප්‍රාථමික ශේෂයේ හිඟයක් ඇති නොවන ලෙස දිගට ම පැවතගෙන යෑම, අර්බුදයෙන් දිගු කාලීන ලෙස නිදහස් වීම සඳහා අත්‍යවශ්‍ය ය. එහි දී රජයට ලැබිය යුතු

ආදායම් එකතු කර ගැනීමත්, රජයේ අනවශ්‍ය සහ නාස්තිකාර වියදම් නවතා දැමීම නැතහොත් අඩු කර ගැනීමත් කළ යුතුව ඇත.

රජයේ ආදායම් සම්බන්ධයෙන් ගත් විට බරපතළ ප්‍රශ්නයක් වන්නේ බදු ගෙවිය යුතු විශාල පිරිසක් බදු ගෙවීම පැහැර හැරීම යි.

බදු රැස් කිරීමේ ආයතනවල පවතින අකාර්යක්ෂමතාවය සහ දූෂිත තත්ත්වයන් උපයෝගී කරගෙන ඇතැම් ව්‍යාපාරිකයෝ බදු ගෙවීම පැහැර හරිති. බදු එකතු කිරීමේ ව්‍යුහය පවතින්නේ ඉතාමත් අකාර්යක්ෂම තත්ත්වයක ය. අය කරගත හැකි බදු ප්‍රමාණය අය කර ගැනීමට හැකියාවක් මෙම අකාර්යක්ෂම ක්‍රමයට නැත. එමෙන් ම, දූෂණය ද බදු පැහැර හැරීමට උපකාරී වන සාධකයකි. එම ක්‍රියා නැවත්වීමට කිසියම් විධිමත් ක්‍රමවේද ක්‍රියාවට නැගීම අවශ්‍ය වී තිබේ. එම ක්ෂේත්‍රයේ පවතින අකාර්යක්ෂමතාවය සහ දූෂණ එහි මුල් බැසගත් සංස්කෘතියක් බවට පත්ව තිබීමත්, තමන්ට වාසි ලබාගන්නා ව්‍යාපාරිකයින් එයට සහය දීමත් නිසා මෙය කියන තරම් පහසු කටයුත්තක් නොවේ.

අනෙක් අතට නිදහස් වෘත්තික කණ්ඩායම් ද බදු ගෙවීම පැහැර හරිමින් සිටින බව පැහැදිලි කරුණකි. එබඳු ඇතැම් වෘත්තිකයින් ලබන ආදායම් ගණනය කිරීමේ ක්‍රමවේද ක්‍රියාවට නැගීම ද අභියෝගයකි.

කොළඹ එක්තරා පෞද්ගලික රෝහලකින් වරෙක දැනගන්නට ලැබුණේ එහි සියලු කවුන්ටර්වල තිබෙන මුදල් සවසට ගිණුම් අංශයෙන් එකතු කරගෙන යන බවකි. එයට හේතුව ලෙස දැනගන්නට ලැබුණේ චැනල් සේවයේ යෙදෙන වෛද්‍යවරුන්ගේ ගෙවීම් මුදලින් පමණක් කළ යුතු වීම යි. වෛද්‍යවරුන් තම ගාස්තු සියල්ල මුදලින් පමණක් ඉල්ලා සිටින්නේ කුමන හේතුවක් නිසා ද යන්න තේරුම් ගැනීම අපහසු නැත.

එලෙස අප රටේ පවතින්නේ බදු ගෙවීම පැහැර හැරීමේ සංස්කෘතියකි. එය වෙනස් කොට බදු ගෙවිය යුතු සියලු දෙනා බදු දැලට හසු කර ගැනීම අවශ්‍ය ය. එමගින් රජයේ ආදායම් ස්ථාවර කර ගැනීමේ සහ වැඩි කර ගැනීමේ හැකියාව ඇත. එසේ වුව ද, එය ක්‍රියාවට නැගීම පහසු නැත. විරෝධතා සහ කඩා කප්පල් ක්‍රියා බහුලව සිදුවනු ඇත. එබැවින් එය අභියෝගයකි.

රජයේ අයවැය තුලනය හෙවත් ප්‍රාථමික ගිණුමේ හිඟයක් වළක්වාගැනීම සඳහා කළ යුතු අනෙක් දෙය නම් රජයේ අනවශ්‍ය සහ නාස්තිකාර වියදම් නතර කිරීම යි.

මෙහි දී මුහුණ දෙන බරපතළ ප්‍රශ්නයක් වී ඇත්තේ අති විශාල රාජ්‍ය සේවයක් නඩත්තු කිරීමට සිදුව තිබීම යි. එහි වැඩි ප්‍රමාණයක් සිටින්නේ අනවශ්‍ය සේවකයින් වශයෙනි. ඒවායේ කාර්ය මණ්ඩල තීරණය වී තිබෙන්නේ තර්කානුකූල පදනමකින් නොවේ. එක් උදාහරණයක් ලෙස පසුගිය කාලයේ කියැවුණේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයට වඩා විශාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටීම යි. එය ලෝකයේ වෙනත් රටවල දකින්නට නොලැබෙන තත්ත්වයකි.

පසුගිය කාලයේ හෙළිදරව් වුයේ කිසිදු වැඩකට නැති ආයතන පවත්වාගෙන යමින් ඒවාට මහජන මුදල් වියදම් කොට ඇති බව යි. රාජ්‍ය වැටුප් කොමිසම එවැන්නකි. එවැනි ආයතන හඳුනාගෙන ඒවා වසා දැමීමට හෝ වෙනත් ආයතන සමග ඒකාබද්ධ කිරීමට රජය කටයුතු කරමින් සිටියි.

හමුදාවේ සංඛ්‍යාව අඩු කිරීමට පියවර ගෙන ඇත්තේ විශ්‍රාම යන පිරිස වෙනුවට අලුතින් බඳවා ගැනීම් නතර කිරීම මගින් නිසා එය පහසු වී තිබේ. දෙලක්ෂයක් සිටි හමුදාව මේ වසර අවසානයේ 150,000 දක්වාත්, 2030 වන විට ලක්ෂයක් දක්වාත් අඩු කරන බව වාර්තා වී ය. නාවික හමුදාව සහ ගුවන් හමුදාව ද අවශ්‍ය මට්ටමට සීමා කරන බව කියති.

එසේ වුවත්, සමස්ත රාජ්‍ය සේවය සම්බන්ධයෙන් එබඳු පහසු විසඳුම් නැත. එහි විශාල පිරිසක් අනවශ්‍ය බව පැහැදිලි ය. සෑම ගමකට ම සමෘද්ධි නිලධාරියකු, කෘෂි නිලධාරියකු, සංවර්ධන නිලධාරියකු අවශ්‍ය ද යන්න ප්‍රශ්නයකි. ඔවුන්ට කරන්නට ප්‍රමාණවත් වැඩ කටයුතු සෑම ගමක ම නැත. ඔවුන් බොහෝ දෙනෙකුට ගෙවන වැටුප් පවතින්නේ ආණ්ඩුවේ නාස්තිකාර වියදම් වශයෙනි.

රාජ්‍ය සේවයේ සිටින මේ අති විශාල සේවක සංඛ්‍යාව සම්බන්ධ ප්‍රශ්නයට පිළිතුරක් දීමට කිසිදු දේශපාලඥයකු ඉදිරිපත් නොවීම පුදුමයට කරුණක් නොවේ. මේ සිටින සේවකයින් ඉවත් කිරීමේ හැකියාවක් නැත. ඔවුන් වෙනත් සේවා වෙත යොමු කරන්නේ නම් එම සේවා තුළ සේවකයින්ට ආකර්ශනීය සේවා සහ ප්‍රතිලාභ සහතික කළ යුතු වෙයි. එය දැවැන්ත අභියෝගයකි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ දැන් කෙරෙන සාකච්ඡා තුළ මතු වූ කරුණක් නම් එම ක්ෂේත්‍රයේ දැනට තිබෙන ආයතන කොතෙක් දුරට ප්‍රයෝජනවත් ද යන්න යි. එමෙන් ම, අපොස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සඳහා අනවශ්‍ය ලෙස විෂයයන් වැඩි කරගෙන ප්‍රශ්න පත්‍ර සැදීම, විභාග පැවැත්වීම, සහ උත්තර පත්‍ර බැලීම ආදී කටයුතු සඳහා විශාල මුදලක් වියදම් කරමින් සිටින බව හෙළි වී තිබේ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවක සංඛ්‍යාව තුන් ගුණයකින් වැඩි බව කියති. එම ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති නායකයකු ප්‍රකාශ කළේ මෙම සේවක පිරිස මෙවැනි තුන් ගුණයක් විශාල සෞඛ්‍ය සේවයක් පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් බව යි. එහි සෑම අංශයක ම අතිරික්තයක් ඇතැයි එයින් අදහස් වන්නේ නැති නමුත් අනවශ්‍ය අංශවල විශාල අතිරික්තයක් සිටින බව පැහැදිලි ය. මෙයින් හෙළි වන්නේ ඒ වැඩිපුර සිටින තුනෙන් දෙකක සේවක පිරිසට ගෙවන වැටුප් නාස්තිකාර වියදමක් බව යි.

එසේ නම් එම වැටුප් ගෙවීම් නතර කළ හැකි ද? එසේ කළ නොහැකි ය. මෙම තත්ත්වයට වගකිව යුත්තේ සේවකයින් නොවේ. එම අවුල නිර්මාණය කොට ඇත්තේ ප්‍රතිපත්ති සම්පාදකයින් විසිනි. එයට වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීත්වය ද බලපාන්නට ඇත.

මේ ප්‍රශ්නවලට ඉක්මන් හෝ පහසු හෝ විසඳුම් නැත. එසේ වුවත්, මෙම ප්‍රශ්න විසඳා නොගෙන අපට අර්බුදයෙන් දිගුකාලීනව ගොඩ යා නොහැකි ය. ප්‍රශ්නවලට පිළිතුරු පමා වන තරමට රටේ සමෘද්ධිය ඇති කිරීම ද ප්‍රමාද වනු ඇත.

වසා දමා ඇති රාජ්‍ය ව්‍යවසාය 19කට අධ්‍යක්ෂ මණ්ඩල පත්කොට වැටුප් ගෙවමින් සිටින බව පසුගිය දා හෙළිදරව් වී ය. ඒවා ඇතුළුව රාජ්‍ය ව්‍යවසාය 130 ක් ප්‍රතිසංවිධානය කිරීමට රජය කටයුතු කරමින් සිටියි. ඇතැම් ආයතන වසා දැමීමට තීරණය කොට ඇත. තවත් ආයතන ගණනාවක් පෞද්ගලික කරණයට යොමු කොට තිබේ. රජය යටතේ තබාගෙන ඇතැම් ආයතන ප්‍රතිසංවිධානය කරන බව ද කියති.

දැන් ඇතැම් පෞද්ගලිකකරණයන් සම්බන්ධයෙන් විරෝධතා මතු වී තිබේ. ප්‍රධාන වශයෙන් විරෝධතා මතු වී තිබෙන්නේ ශ්‍රී ලන්කන් ගුවන් සේවය , ටෙලිකොම් ආයතනය සහ ලිට්‍රෝ ගෑස් පෞද්ගලික කරණයට ය.

එමිරේට්ස් සමාගමට භාර දී හොඳින් පවත්වාගෙන ගොස් රජයට ලාභාංශ ද ලබාදුන් ශ්‍රී ලන්කන් සමාගම යළි රජයට ගෙන දැවැන්ත පාඩු ලබන තත්ත්වයට පත් කළේ මහින්ද රාජපක්ෂ පාලනය යි. එය යළි පෞද්ගලිකකරණයට කිසිවකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය හෝ පෙනී සිටින්නේ මහින්ද රාජපක්ෂ පාලනයේ තීරණය සාධාරණීකරණය වෙනුවෙනි. කුමක් කිව්වත් හරය වශයෙන් සිදුවන්නේ එය යි.

ලිට්රෝ සමාගම සම්බන්ධයෙන් ද එම කතාව වලංගු ය. රජයේ ආයතන ජනතාවට ඉතා හොඳ සේවයක් සලසන බවට මතවාදයක් තිබේ. ලිට්රෝ

සමාගම ගෝඨාභය රාජපක්ෂ යුගයේ ගෑස් සංයුතිය වෙනස් කිරීම නිසා සිදුවුන දේපළ සහ ජීවිත හානි පිළිබඳව කුමක් සිදුවූයේ ද?

එක් තර්කයක් නම් මෙම ඇතැම් ආයතන ලාභ ලබන බව යි. එසේ වුවත්, පෙන්නුම් කරන ලාභ ඒවාට යොදා ඇති සම්පත් ප්‍රමාණය අනුව ප්‍රමාණවත් නැත.

රුපියල් බිලියන 80 ක රජය සතු වත්කම් ඇතැයි කියන ටෙලිකොම් ආයතනය රජයට ගෙවන ලාභාංශය මිලියන සිය ගණනක් බව වාර්තා වී ඇත. එහි රජය සතු කොටස් විකුණා මුදල් බැංකුවක තැන්පත් කළහොත් රුපියල් බිලියන අටක, දහයක පොළී ආදායමක් ලබා ගත හැකි වෙයි.

රාජ්‍ය ආයතන ඇතැම් විට ආදායම් ලබන්නේ තරගකාරී නොවන ආකාරයෙනි. එනම්, රජයේ වෙනත් ආයතනවලට සේවා සැපයීමේ දී ප්‍රමුඛතාව ලබා ගැනීම මගින් ය. රක්ෂණ සංස්ථාව සහ ශ්‍රී ලංකා ටෙලිකොම් එයට හොඳ උදාහරණ වෙයි. පසුව වෙළෙඳ පොළට ආ ඩයලොග් සමාගම ටෙලිකොම් සමාගමට වඩා ඉදිරියෙන් ද සෙලින්කෝ සමාගම රක්ෂණ සංස්ථාවට වඩා ඉදිරියෙන් ද සිටිති.

අනෙක් අතට මේ ආයතනවලට තම සේවා කාර්යක්ෂම ලෙස සැපයීමේ හැකියාව ද නැත. ලිට්රෝ ගෑස් නව සිලින්ඩරයක් ලබා ගැනීම මේ මොහොතේ ද දුෂ්කර කටයුත්තකි. භාවිතා කළ හිස් සිලින්ඩර් වෙනුවට ගෑස් සහිත සිලින්ඩර් නිකුත් කිරීම පමණක් සිදුවෙයි. නව සිලින්ඩර් නිකුත් කිරීමක් නැත. නිකුත් කරන සිලින්ඩර් බොහොමයක් ද මළ බැඳුනු තත්ත්වයේ හෝ එම තත්ත්වයට පත් වෙමින් හෝ තිබේ. එහි තේරුම නම් ඔවුන්ට තම සේවාව කාර්යක්ෂම ලෙස සැලසිය නොහැකි වී ඇති බව යි.

රටට අද අවශ්‍ය වේගවත් සංවර්ධනය කළ හැක්කේ කාර්යක්ෂම ආයතන පද්ධතියක් මගින් ය. එය කළ හැක්කේ මෙබඳු වාහිජ ආයතන පෞද්ගලික අංශයට පැවරීමෙනි. 1956 සිට රජය පුද්ගලික අංශයෙන් අත්පත් කරගත් ධනය නැවත පුද්ගලික අංශයට දිය යුතු ය.

තවත් පැත්තකින් මෙම ආයතන විකුණා මුදල් ලබා ගැනීම ද අවශ්‍ය වෙයි. ආර්ථික සංවර්ධනය සඳහා රජය කළ යුතු අත්‍යවශ්‍ය වියදම් දැරීමට රජයට මුදල් අවශ්‍ය ය. යෝජිත නව නිදහස් ආර්ථික කලාපවල යටිතල පහසුකම් සැපයීම වැනි කටයුතු සඳහා රජය ප්‍රමුඛතාව දී වියදම් කළ යුතු ය.

මෙලෙස ආර්ථික අර්බුදයේ එක් ප්‍රධාන සංයුක්ත ප්‍රශ්නයක් වන රජයේ වියදම් කළමනාකරණය ස්ථාවර ලෙස දිගුකල් පවත්වාගෙන යෑම සඳහා ඇත්තේ අභියෝග රැසක් හමුවන මාර්ගයකි. එම අභියෝග ජය ගැනීමකින් තොරව ආර්ථික අර්බුදයෙන් සාර්ථක ගොඩ යාමක් නැත.

## විදේශ විනිමය අර්බුදයේ අභියෝගය

ආර්ථික අර්බුදයේ දෙවැනි සංයුක්ත කොටස ලෙස හඳුනාගත හැකි ජංගම ගිණුමේ හිඟය හෙවත් ගෙවුම් ශේෂ ප්‍රශ්නය යනු රටේ ආනයන අපනයන සම්බන්ධ ප්‍රශ්නයකි. එහි අර්බුදය ආර්ථිකයේ බිඳ වැටීමක් තත්ත්වයට දරුණු වූ පසුව දැන් අප එයට තාවකාලික පිළියම් යොදා ගෙන ඇත. එසේ වුවත්, ප්‍රශ්නය ස්ථිර ලෙස දිගුකාලීන ලෙස විසඳා ගැනීමේ අභියෝගය තවමත් ජයගත යුතුව පවතියි.

ප්‍රශ්නයට විසඳුම් ලෙස පැනවූ ආනයන සීමා තවමත් සම්පූර්ණයෙන් ඉවත් කොට නැත. මේ වන විට වර්ධනය කොටගෙන ඇති අපනයන ආදායම එයට තවමත් ප්‍රමාණවත් නැති බවට සැකයක් නැත.

විදේශ විනිමය හෙවත් ඩොලර් ඉපයීමට අප ඉදිරියේ ඇති ක්‍රියාමාර්ග කෙටි කාලීන, මැද කාලීන සහ දිගු කාලීන වශයෙන් හඳුනාගත හැකි ය. එනම් ඉක්මනින් ප්‍රතිඵල ලැබිය හැකි ක්‍රම, කෙටි කලෙකින් ක්‍රියාවට නගින හැකි ක්‍රම සහ දිගු කාලීන ක්‍රම වශයෙනි.

එම ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරාත්මක විවරණයක් කිරීමට මෙහි දී උත්සාහ දරන්නේ නැත. එසේ වුව ද, එම වෙනස් ක්‍රියාමාර්ග පිළිබඳ දළ සටහනක් අවශ්‍ය බව පෙනෙන්නට තිබේ. රටේ සැබෑවට ම සිදුවන දේ තේරුම් ගැනීම සඳහා එබඳු ඉදිරිපත් කිරීමක් ආධාර වනු ඇත.

2022 ආර්ථිකය කඩා වැටීමත්, විදේශ විනිමය සොයා ගැනීමේ අර්බුදයත් හමුවේ රජය ඉක්මනින් ප්‍රතිඵල ගත හැකි ක්ෂේත්‍ර දෙකකට දැඩි අවධානයක් යොමු කළ බව පෙනෙන්නට තිබිණි. එනම්, විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීම සහ සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම යි. එම ක්‍රියා මාර්ග සාර්ථක වී ඇති බව සංඛ්‍යාලේඛන මගින් මෙන් ම රුපියල ශක්තිමත් වීම මගින් ද පෙන්නුම් කරයි.

සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් රජය කටයුතු කරන්නේ ඉක්මන් ප්‍රතිඵල පමණක් නොව දිගුකාලීන වශයෙන් ද වර්ධනය කළ හැකි ක්ෂේත්‍රයක් වශයෙනි. සංචාරක ව්‍යාපාරය පවතින ප්‍රදේශවල ජනාධිපති රනිල් වික්‍රමසිංහ

මහතා පෞද්ගලිකව ම සංචාරය කරමින් එම කටයුතු ප්‍රවර්ධනය දිරිමත් කරනු දක්නට ලැබිණි.

විවිධ ව්‍යාපෘති සඳහා ආයෝජන සහ ණය ලබා ගැනීමට ද රජය කටයුතු කරමින් සිටින බව ප්‍රකාශිත ය. මධ්‍යම අධිවේගී මාර්ගය, සැහැල්ලු දුම්රිය සේවය ඇතුළු ව්‍යාපෘති රාශියක් දැනට සුදානම් ය. බොහෝ විට ඒවා වේගවත් ලෙස ක්‍රියාත්මක වනු ඇත්තේ ණය ප්‍රතිව්‍යුහගත කරණයෙන් පසුව ය.

මෙලෙස ව්‍යාපෘති ආධාර සහ ණය ලෙස රට තුළට විදේශ මුදල් ලැබීම අර්බුදයෙන් ගොඩ යාමට පහසුවක් වන නමුත්, ඒ මත දිගු කාලීන ලෙස රැඳී සිටීම නොකළ යුත්තකි. දිගු කාලීන විසඳුම් විය යුත්තේ අපනයන ආදායම ඉහළ දමා ගැනීම යි.

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ඉන්ධන භාවිතය මත යැපීම අඩු කළ හැකි ය. එය මැද කාලීන වශයෙනි. දිගු කාලීන සැලසුම වී ඇත්තේ ඉන්දියාව සමග විදුලි පද්ධතිය සම්බන්ධ කිරීම සහ විදුලි බලය අපනයනය යි.

කිරි ගොවිතැන සහ නිෂ්පාදන නගා සිටුවීම සඳහා ද රජය විශාල බරක් යොදා ක්‍රියාත්මක වන බව පෙනෙන්නට තිබේ. අපගේ ආකාර්යක්ෂම කිරි ගොවිතැන දියුණු කිරීමට ඉන්දියාවේ අමුල් සමගම සහ ගිවිසුම් ගත වීම එහි ප්‍රධාන පියවරකි. අනෙක් කිරි නිෂ්පාදකයින්ට ද පහසුකම් සැපයීමට ක්‍රියා කොට ඇත.

මෙබඳු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යම් ඉලක්ක සහිතව කළ හැකි ය. විදුලි ව්‍යාපෘතියක ජනන හැකියාව කල් තබා ගණනය කළ හැකි ය. දිනකට කිරි ලීටර් 20 ක් දෙන කිරි දෙනුන් මිලියන දෙකක් ගැන ඉලක්ක කොට වැඩ කළ හැකි ය. එය වාසිදායක තත්ත්වයකි.

කෙසේ වෙතත්, අපනයන ආදායම ස්ථිර ලෙස වර්ධනය කර ගැනීමේ දිගු කාලීන සැලසුම් යටතේ කරන්නට තිබෙන්නේ නිෂ්පාදන කටයුතු සඳහා දේශීය, විදේශීය පෞද්ගලික ආයෝජකයින් දිරි ගන්වා වර්ධනය කිරීම යි. එහි දී රජයට පැවරෙන්නේ පහසුකම් සැපයීමේ කාරය භාරය යි. නිෂ්පාදනය පිළිබඳ තීරණ ගැනීම ආයෝජකයින් සතු කාර්යයක් වනු ඇත. එම කටයුත්ත රජයට කළ හැක්කක් හෝ රජය කළ යුත්තක් හෝ නොවේ.

ආයෝජකයින් යොදවන්නේ තමන්ගේ මුදල් ය. එහි අවදානම ගන්නේ ඔවුන් ය. ඔවුන් එය සිදු කරන්නේ තමන්ගේ ම අධ්‍යයනයන්ගෙන් පසුව ය.

තමන්ගේ මුදල්වලින් රජය කියන දේ කරන්නට ඔවුන් ඉදිරිපත් වනු ඇතැයි සිතීම මුලාවකි. රජය එබඳු බලපෑම් කළොත් ඔවුන් කරනු ඇත්තේ තමන්ට කැමති දේ කළ හැකි වෙනත් රටක් සොයා ගොස් ආයෝජනය කිරීම යි.

මෙලෙස අපනයන වර්ධනය කරන ආර්ථිකයක් සඳහා විදේශ ආයෝජන අවශ්‍ය බව අද දියුණුවන ලෝකයේ බොහෝ රටවල් දන්නා කාරණයකි. එම අවශ්‍යතාවය තේරුම් ගැනීම අත්‍යවශ්‍ය ය. එමෙන් ම ඒ සඳහා කැපවීම ද අවශ්‍ය වෙයි.

අපගේ ආර්ථික අර්බුදයෙන් ස්ථිර ලෙස ගොඩ යාමට නම් විදේශ විනිමය අවශ්‍ය තරම් උපයන පරිදි අපනයන වර්ධනය කර ගැනීමත්, ඒ සඳහා විදේශ ආයෝජන ලබා ගැනීමත්, අත්‍යවශ්‍ය වුවත් එය බරපතළ අභියෝගයක් වන්නේ එම ආයෝජන ගැන මිථ්‍යා අදහස් රාශියක් පැවතීම හේතුවෙනි. ආර්ථිකයක් වර්ධනය වීමේ ගතිකයන් පිළිබඳ අවබෝධයක් නොමැතිව ප්‍රචලිත කරන එම මිථ්‍යා අදහස් ආර්ථික සංවර්ධනයට තිබෙන ප්‍රබල බාධක ලෙස ක්‍රියා කරයි.

විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය එක් ප්‍රධාන කරුණක් වන්නේ දූෂණයට ඉඩ නොතැබීම යි. ඒ සඳහා නීති පද්ධතිය ශක්තිමත් විය යුතු ය. විදේශ ආයෝජන ගැන තීරණ ගැනීම දේශපාලඥයන්ගේ සහ නිලධාරීන්ගේ අභිමතය අනුව නොව පිළිගත් නීති රාමුවක් සහ ක්‍රියා පටිපාටියක් අනුව සිදුවිය යුතු ය. තමන්ට වැඩ කරන්නට තිබෙන නීතිමය රාමුව ආයෝජකයින්ට පැහැදිලි විය යුතු ය. පිළිගත් ක්‍රියා පටිපාටි අනුව ක්‍රියා කරන විට කාගේවත් අනුමැතියක් ගැනීම අවශ්‍ය නොවන තත්ත්වයක් සකස් කළ යුතු ය.

මේ වන විට දූෂණ විරෝධී නව නීතියක් ක්‍රියාත්මක ය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය දා කීවේ ආර්ථික කටයුතු විධිමත් කිරීමට නව නීති ඇතුළත් පනත් 42 ක් මේ වන විට සම්මත කොට ඇති බව යි. තවත් පනත් 62 ක් ඉදිරි කාලයේ ඉදිරිපත් කිරීමට නියමිත බව ද ජනාධිපතිතුමා කී ය. එම නීති ප්‍රමාණවත් ද එයින් අවශ්‍ය අරමුණු ඉටු වන්නේ දො යන්න වෙන ම සාකච්ඡාවකි.

විදෙස් ආයෝජකයින් ඉක්මනින් ගෙන්වා ගැනීමට ඇති එක් ක්‍රමයක් නම් රජයට අයිති ව්‍යවසාය ඔවුන්ට විකිණීම යි. නැතහොත් හවුල් ව්‍යාපාර ගොඩ නැගීම යි.

සමහරුන් අහන්නේ ඔවුන්ට අවශ්‍ය නම් අලුත් ව්‍යාපාර ඇරඹිය හැකිව තිබිය දී තිබෙන ව්‍යාපාර විකුණන්නේ කුමට ද යනුවෙනි. නමුත් රටක

ආයෝජනයකට පැමිණෙන සමාගම් වඩා කැමති වන්නේ තිබෙන ව්‍යාපාරයක් සමග හවුල් ව්‍යාපාරයක් කරන්නට හෝ ව්‍යාපාරයක් මිල දී ගන්නට ය. එවිට නව සමාගමක් ලියාපදිංචි කිරීම, ඉඩම්, ගොඩනැගිලි ආදිය සපයා ගැනීම, කාර්ය මණ්ඩල බඳවා ගැනීම ආදී ප්‍රාථමික වැඩ කටයුතු බොහොමයක් මග හැරිය හැකි ය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාවහන් නිෂ්පාදකයෙකු ඉන්දියානු වෙළෙඳපොළට පිවිසුනේ එරට සමාගමක් මිල දී ගෙන ය. බිස්කට් නිෂ්පාදන සමාගම් දෙකක් ද කළේ එය ම ය. ප්‍රධාන සිසිල් බීම නිෂ්පාදන සමාගමක් මෑතක දී කළේ ඉන්දියානු සමාගමක් සමග හවුල් වීම යි. සොයා බැලුවහොත් තවත් බොහෝ නිදසුන් සපයා ගත හැකි ය.

ලෝකයේ ප්‍රධාන ටයර් නිෂ්පාදන සමාගමක් වන මිචෙලින් සමාගමට ශ්‍රී ලංකාවේ ටයර් නිෂ්පාදන ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය විය. අලුත් ටයර් කර්මාන්ත ශාලාවක් ඇරඹීමට සියලු හැකියා සහ සම්පත් එම සමාගම සතුව ඇති බව අමුතුවෙන් කිව යුතු නැත. නමුත් මිචෙලින් සමාගම කළේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාගමක් බවට පත්ව සිටි ලෝඩ්ස්ටාර් සමාගම මිල දී ගැනීම යි. විදෙස් ආයෝජන පහසුවෙන් රටවල් තුළට එන්නේ ඒ ආකාරයෙනි.

එබැවින් විදේශ ආයෝජන ගෙන්වා ගැනීමේ පහසු ම ක්‍රමය වන්නේ අප සතු සමාගම් විකිණීම ය. නැතහොත් හවුල් ව්‍යාපාර ඇතිකර ගැනීම ය.

තවත් විරෝධයක් වන්නේ විදේශ සමාගම් මෙරට ව්‍යාපාර කර ලාභ රැගෙන යනු ඇති බව යි. මෙය වත්මන් ලෝකයේ ව්‍යාපාර ක්‍රියාත්මක වන ආකාරය ගැන අවබෝධයකින් තොරව කරන ප්‍රකාශයකි.

වත්මන් ලෝකයේ විශාල සමාගම් පමණක් නොව ගමේ කුඩා ව්‍යාපාරිකයා පවා තමන්ගේ ලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ගන්නේ නැත. කරන්නේ ලාභවලින් යැපීමට කොටසක් අයින් කර ඉතිරි කොටස යළි ආයෝජනය කොට ව්‍යාපාරය වර්ධනය කර ගැනීම යි.

ව්‍යාපාර දිගින් දිගට වර්ධනය වන්නේ ඒ ආකාරයෙනි. එනම් ලාභ නැවත නැවත ආයෝජනය කරමින් ය. කාල් මාක්ස් මෙය දුටුවේ ධනපති නිෂ්පාදන ක්‍රමයේ වර්ධනයේ නියාමයක් වශයෙනි. ඔහු එය හඳුන්වන ලද්දේ ප්‍රාග්ධන සංචිතකරණය (Accumulation of Capital) වශයෙනි.

අද ලෝකයේ විශාල සමාගම්වල ප්‍රධාන කොටස් හිමියෝ සමාගම්වලින් දෙවරක් ගෙවීම් ලබා ගනිති. පළමුවැන්න විධායක නිලධාරියකු ලෙස කටයුතු

කිරීම සඳහා ලබා ගන්නා විශාල වැටුප යි. දෙවැන්න වරින් වර ලාභාංශ ලෙස ලබාදෙන මුදල යි. එලෙස ලබා දෙන්නේ සම්පූර්ණ ලාභයෙන් සුළු කොටසකි. ප්‍රධාන කොටස නැවත ආයෝජනය කරනු ලබයි. එහි ප්‍රතිඵලය වන්නේ සමාගමේ කොටස් මිල ඉහළ යෑම යි. කොටස් හිමියකුට තම කොටස විකුණා ලාභය ලබාගත හැකි නමුත් එයින් එම ලාභය සමාගමෙන් පිට යන්නේ නැත.

මෙරටට මීට පෙර පැමිණි විදේශ ආයෝජකයින් ගැන සොයා බැලුවහොත් ඔවුන් වැඩි දෙනෙකු තම ලාභ නැවත ආයෝජනය කරමින් ව්‍යාපාර වර්ධනය කළ බව දැකගත හැකි වෙයි.

ඇතැම් ආයෝජකයින් තම ව්‍යාපාර විකුණා ඉවත්ව යන අවස්ථා ඇත. එවිට ආයෝජනයේ අයිතිය වෙනස්වීම මිස ආයෝජනය ආපසු යන්නේ නැත.

දේශීය වෙළෙඳපොළේ ව්‍යාපාර කරන්නට විදේශ ආයෝජන අවශ්‍ය නැතැයි යන්න තවත් තර්කයකි. එම තර්කයට හොඳම පිළිතුර වන්නේ මෙබඳු ම විරෝධතා මැද විකුණා දැමූ කැලණියේ ටයර් සංස්ථාවේ පෞද්ගලිකකරණයේ අත් දැකීම යි. විකුණන විට එහි තිබුණේ දේශීය වෙළෙඳපොළට ටයර් නිපදවන අකාර්යක්ෂම කම්හලකි. දැන් එහි ඇත්තේ විදේශ වෙළෙඳපොළට විවිධ නිෂ්පාදන අපනයනය කරන ව්‍යාපාරයකි.

විදේශ ආයෝජනවලට ඉඩ දෙන්නේ අපට තාක්ෂණය නැති සහ/හෝ අපට කරන්නට බැරි නිෂ්පාදන සඳහා පමණක් යැයි කතාවක් ද කියති. මෙම ප්‍රතිපත්තිය ඉන්දියාව ක්‍රියාත්මක කළේ නම් ශ්‍රී ලංකාවේ බිස්කට් නිෂ්පාදකයින්ට, බීම නිෂ්පාදකයින්ට, සපත්තු නිෂ්පාදකයින්ට, ගෘහ භාණ්ඩ නිෂ්පාදකයින්ට ඉන්දියාවේ ව්‍යාපාරික අවස්ථා විවර වන්නේ නැත.

ඇමෙරිකාව වාහන නිෂ්පාදනයේ ඉහළ ම තාක්ෂණයක් ඇති රටකි. එරට ජනයාට වාහන විකුණන්නට ටොයෝටා කර්මාන්ත ශාලාවක් ඇරඹීමට එරට පාලකයින් ඉඩ දුන්නේ ඔවුන් දේශද්‍රෝහීන් නිසා ද යන්න ප්‍රශ්න කළ හැකි ය.

අපට කරන්නට බැරි වැඩ සඳහා පමණක් විදෙස් ආයෝජන යන ප්‍රතිපත්තිය වර්තමාන ලෝකයේ ආර්ථික සංවර්ධන උපායමාර්ග සමග ගැලපෙන්නක් නොවන බව ඒ අනුව තේරුම් ගත යුතු ය.

කලකට ඉහත 1970 ගණන්වල බහු ජාතික සමාගම් පිළිබඳව අනියත බියක් අප අතර විය. මේ වන විට ශ්‍රී ලංකාව මුලස්ථානය කරගත් බහු ජාතික සමාගම්

බොහොමයක් අපට තිබේ. හේලීස්, එයිට්කන් ස්පෙන්ස් සහ කොමර්ෂල් බැංකුව කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තු ගත බහු ජාතික සමාගම් ය. එයට අමතරව කොටස් වෙළෙඳපොළේ නැති බොහොමයක් බහු ජාතික සමාගම් ද තිබේ. ඒවා අපේ ජාතික සම්පත්ය.

## වෙළෙඳ ගිවිසුම්

විදේශ මෙන් ම, දේශීය ආයෝජන ද ප්‍රවර්ධනය සඳහා ලෝක වෙළෙඳ පොළේ අපට තිබෙන අවස්ථා පුළුල් කර ගැනීම අවශ්‍ය ය. විදේශ වෙළෙඳපොළ මෙරට නිෂ්පාදන සඳහා විවෘත කරගත යුතු ය. එය කළ හැකි සාර්ථක මාර්ගයක් වන්නේ වෙළෙඳ ගිවිසුම්වලට ඇතුළත් වීම යි.

ඉන්දියාව පකිස්ථානය ඇතුළු රටවල් කිහිපයක් සමග වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් අපට ඇත. සිංගප්පූරුව සමග සහ මෑතක දී තායිලන්තය සමග ද වෙළෙඳ ගිවිසුම් අත්සන් තබා ඇත. තවත් රටවල් සමග සාකච්ඡා අරඹා ඇත.

දැන් උත්සාහය වන්නේ ඉන්දියාව සමග විස්තීර්ණ වෙළෙඳ ගිවිසුමකට ඇතුළත් වීමට ය. ඉක්මනින් එයට අත්සන් තබන බව වාර්තා වී ඇත.

මෙම ගිවිසුම් මගින් කරන්නේ අවට රටවල වෙළෙඳපොළ මෙරට නිෂ්පාදන සඳහා වඩා විවෘත කර ගැනීම යි.

අප රටේ පිහිටීම අනුව කලාප කිහිපයක වෙළෙඳපොළ සඳහා ප්‍රවේශ දොරටුවක් ලෙස ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ හැකියාව ඇත. ඉන්දියාව, නැගෙනහිර ආසියාව, අප්‍රිකාව සහ මැද පෙරදිගට භාණ්ඩ සහ සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව වැදගත් විය හැකි ය.

ශ්‍රී ලංකාවට තායිලන්ත වෙළෙඳ ගිවිසුම වැදගත් වන්නේ එරට වෙළෙඳපොළ නිසා පමණක් නොවේ. නැගෙනහිර ආසියානු කලාපයට ප්‍රවේශ දොරටුවක් ද වන නිසා ය. තායිලන්තයට එය වැදගත් වන්නේ ඉන්දියානු වෙළෙඳපොළට ප්‍රවේශයක් වීම ද සැලකිල්ලට ගත් විට ය.

විදේශ ආයෝජකයින් සඳහා ශ්‍රී ලංකාවේ වැදගත්කම විය හැක්කේ ඉන්දියානු වෙළෙඳපොළ යි. මෙහි සිට ඉන්දියානු වෙළෙඳපොළට ප්‍රවේශ වීමේ අවස්ථාව ආයෝජකයින්ට විකිණීමට අප දක්ෂ විය යුතු ය. ඒ සඳහා වෙළෙඳ ගිවිසුම් මගින් ඉන්දියානු වෙළෙඳපොළ විවෘත කරගත යුතු ය.

එමෙන් ම, විදේශ වෙළෙඳ පොළට පිවිසෙන විට අප ශක්තිමත් වෙමින් එය කළ යුතු වෙයි. එම ශක්තිය ද අපට ලැබෙන්නේ විදේශ ආයෝජන ලබා ගනිමින් ආර්ථිකය ශක්තිමත් කර ගැනීම මගින් ය.

තවත් බොහෝ රටවල් සමග වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීම ආර්ථික සංවර්ධනයට වැදගත් ය. එබඳු වෙළෙඳ ගිවිසුම් සඳහා සම්මත ආකෘති නැත. එක් එක් වෙළෙඳ ගිවිසුම ඒ ඒ රටවල නිෂ්පාදන සහ වෙළෙඳපොළ අවශ්‍යතා සලකා බලමින් වෙන වෙන ම සාකච්ඡා කොට එකඟ විය යුතු ය. එය විශේෂඥතාවයක් අවශ්‍ය කාර්යයකි. වැදගත් වන්නේ සියලු දෙනා එම සංකීර්ණත්වය තේරුම් ගෙන ක්‍රියා කිරීම යි.

## සංවර්ධනයට එරෙහි මිථ්‍යා විශ්වාස

මෙම සංවර්ධන ක්‍රියාවලියට එරෙහිව ඉදිරිපත්වන විවේචන පිටුපස බොහෝ විට දකින්නට ලැබෙන්නේ තොරතුරු නැතහොත් දත්ත මත පදනම් වූ අදහස් නොවේ. ඒ වෙනුවට එම ඇතැම් පිරිස් තුළ තිබෙන ඇතැම් මුල් බැසගත් මිථ්‍යා විශ්වාස මෙම විරෝධතා සඳහා හේතුවන බව පෙනෙන්නට තිබේ.

ප්ලේටෝ නම් ග්‍රීක දාර්ශනිකයා මීට වසර 2400 කට පෙර ප්‍රකාශ කළේ සත්‍යයේ පරම සතුරා විශ්වාසය (Belief) බව යි. මෙහි දී විශ්වාසය යන වචනය යෙදෙන්නේ එහි ඇති ඇදහිල්ල නැතහොත් මිථ්‍යා විශ්වාස යන අදහසින් බව පෙනෙන්නට තිබේ.

එයින් කියැවෙන්නේ මෙය මෙසේ විය යුතු යැයි යමෙකු දැඩි විශ්වාසයක නැතහොත් ඇදහිල්ලක සිටින විට ඔහුට හෝ ඇයට හෝ සත්‍යය අවබෝධ කරගත නොහැකි වන බව යි. එවිට සිදුවන්නේ තමා විශ්වාස කරන දේ අනුව තත්ත්වය විග්‍රහ කර ගැනීමට උත්සාහ දැරීම යි. තමන්ගේ විශ්වාසයට නොගැළපෙන කරුණු මඟ හැර ගැලපෙන කරුණු සොයා ගැනීමට උත්සාහ දැරීම එවිට සිදුවෙයි.

අරගලය සමයේ ඇතැම් පිරිස් ප්‍රචලිත කරන්නට උත්සාහ කළ එක් අදහසක් නම් හැත්තෑ හතර වසරක සාපය යන්න යි. එම අදහස ඉදිරිපත් කළ එක් කණ්ඩායමක විශ්වාසයට අනුව පසුගිය වසර හැත්තෑ හතරක කාලය තුළ මෙරට ක්‍රියාත්මක වුයේ ඔවුන් විපතක් ලෙස දකින ධනපති ආර්ථික ක්‍රමය

යි. ඔවුන්ට අනුව එම ක්‍රමය තුළ සිදුවන්නේ දුප්පතුන් තවත් දුප්පත් කිරීම සහ පොහොසතුන් තවත් පොහොසත් කිරීම පමණකි. ඒ අනුව සිදුවිය යුතු යැයි ඔවුන් සිතන්නේ වසර හැත්තෑ හතරක් තිස්සේ මෙරට දුප්පත් ජනයා තව තවත් දුප්පත් වීම යි. ඔවුන්ගේ එම මතය සත්‍ය වීමට නම් මෙරටට නිදහස ලැබෙන විට, එනම්, අධිරාජ්‍යවාදී පාලනය අවසන් වන විට මෙරට දුප්පත් ජනයා සැහෙන පොහොසත් පිරිසක් විය යුතු ය. එසේ නැතිනම් වසර හැත්තෑ හතරක් තිස්සේ දිගින් දිගට දුප්පත් වෙමින් ජීවත් වන්නට හැකි වන්නේ නැත.

ඔවුන්ට අනුව සිස්ටම් චේන්ජ් යනු මෙම ක්‍රමය වෙනස් කොට ඔවුන් සමාජවාදී යැයි සිතන ක්‍රමය බිහි කිරීම යි.

අවුරුදු හැත්තෑ හතරක සමාජ ආර්ථික දත්ත මගින් පෙන්වන චිත්‍රය මගින් සාපය පිළිබඳ ඔවුන්ගේ අදහස සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප වෙයි. එසේ වුවත්, ඔවුහු එය ම විශ්වාස කරති. විශ්වාසය හෙවත් ඇදහිල්ල ක්‍රියාත්මක වන්නේ ඒ ආකාරයෙනි. සත්‍යයේ පරම සතුරා විශ්වාසය නැතහොත් ඇදහිල්ල බව ප්ලේටෝ කියන කතාව සත්‍ය බව මෙබඳු උදාහරණ මගින් තේරුම් ගත හැකි ය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගිය රටක් ගොඩ ගියේ නැතැයි කියන කතාව ද එවැන්නකි. එය පැන නගින්නේ සත්‍ය කරුණු තුළින් නොව ඔවුන්ගේ හිස් තුළ තිබෙන විශ්වාසයෙනි. සෝවියට් කඳවුරේ තිබූ රටවල් හැරුණු විට පසුගිය වසර හැත්තෑ පහක පමණ කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ සටහන් ක්‍රියාත්මක නොකළ රටක් නැති තරම් ය. රටේ ආර්ථික අර්බුදයක් ඇති වූ විට අයි එම් එෆ් යන්න කියා ප්‍රාමාණික බුද්ධිමතුන් එක හඬින් කියන්නේ එම අත්දැකීම් නිසා ය. ඇතැම් රටවල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ සටහන් අතරමග නතර කිරීම නිසා අර්බුද දිග් ගස්සා ගත් අවස්ථා ඇත. නමුත් එය සමස්තය නොවේ.

අයි එම් එෆ් ගිය රටක් ගොඩ ගියේ නැතැයි මොවුන් තවමත් කියන්නේ මූල්‍ය අරමුදලේ වැඩ සටහන ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාව ද අර්බුදයෙන් ගොඩ යමින් සිටින බව පැහැදිලිව පෙනෙන්නට තිබිය දී ය. ඔවුන් ඒ කියන්නේ ඔවුන්ගේ විශ්වාසය නොහොත් ඇදහිල්ල ය. එය සත්‍යයට සතුරු ය. ප්ලේටෝ වසර 2400 කට පෙර පෙන්වා දුන්නේ මේ සත්‍යය යි.

## ආදායම් විෂමතාවය ගැන ඇත්ත සහ යථාර්ථය

වත්මන් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ආදායම් විෂමතාවය වැඩි වීම ඇත්ත ප්‍රශ්නයකි. එය හැකි තාක් අඩු කිරීම වෙනුවෙන් බොහෝ දෙනා පෙනී සිටිති. ආදායම් විෂමතාවය අඩු කිරීම තෘප්තිමත් සමාජයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය වෙයි.

එසේ වුවත්, ඇතැම් කණ්ඩායම් මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ අතිශයෝක්තියෙනි. එමෙන් ම, එහි හරය ගැන තේරුමකින් තොරව ය. එමෙන් ම, ආදායම් විෂමතාවය ඇතැම් පිරිස් හුවා දක්වන්නේ ඔවුන් විශ්වාස කරන පරිදි පොහොසතුන් තවත් පොහොසත් වෙද්දී දුප්පතුන් තවත් දුප්පත් වන බව පෙන්වන දත්තයක් වශයෙනි.

මෙම සංඛ්‍යා ලේඛන තුළ කරන වරද නම් එකිනෙකට වෙනස් වටිනාකම් දෙකක් එක ලෙස සලකා සංසන්දනය කිරීම යි. ඒ එකිනෙක මගින් සිදුවන ක්‍රියාව පිළිබඳව අවධානය යොමු නොකිරීම නිසා ප්‍රකාශ වන්නේ වැරදි චිත්‍රයකි.

පහළ පන්තියේ ජනයාගේ ආදායම වන්නේ ඔවුන්ගේ වැටුපය යන්න බොහෝ විට පවතින සාමාන්‍ය තත්ත්වය යි. එයින් සිදුවන කාර්යය වන්නේ ඔවුන්ගේ යැපීම යි. ජීවිත පවත්වාගෙන යෑම යි. පහළ ම ආදායම් ලබන ජනයාගේ ආදායමෙන් වැඩිම ප්‍රතිශතයක් වැය වන්නේ ආහාර සඳහා ය. ආදායම වැඩි වන විට ආහාර වියදම ප්‍රතිශතයක් ලෙස අඩු වෙමින් වෙනත් අවශ්‍යතා සඳහා වියදම් වැඩි වෙයි. අධ්‍යාපනය ඇතුළු විවිධ ආයෝජන සඳහා මුදල් යෙදවීම වැඩි වන්නේ ආදායම් මට්ටම ඉහළ යන ප්‍රමාණයට ය.

ඉහළ පන්තියේ ව්‍යවසායකයෝ ද ඔවුන්ට වැඩි කොටස් හිමි ආයතනවල විධායක නිලධාරීන් සේ වැඩ කරමින් ඉතා ඉහළ වැටුප් ලබති. ඔවුන්ගේ ආයතනවල ලාභයෙන් කොටසක් ලාභාංශ ලෙස ද ඔවුහු ලබා ගනිති. එසේ වුවත්, ව්‍යවසාය මගින් ඔවුන් ලබන ලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ගැනීමක් සිදු වන්නේ නැත. සිදුවන්නේ එම ලාභ නැවත ආයෝජනය කිරීම යි. ඔවුන් වැටුප් සහ ලාභාංශ ලෙස ලබන මුදලින් කොටසක් ද ආයෝජන බවට පත්වනවා විය හැකි ය.

ව්‍යවසායකයින්ට නැතහොත් ධනපතියන්ට තමන් ලබන ලාභ සම්පූර්ණයෙන් හෝ වැඩි කොටසක් හෝ පරිභෝජනය කිරීමේ හැකියාවක් නැත. නැව් බඳ දෙක තුනක් තරම් විශාල බඩවල් නැතිව ධනපතියකු වී කුමට ද යනුවෙන්

ප්‍රශ්න කරමින් මැක්සිම් ගෝර්කි මතු කළේ මෙම ප්‍රශ්නය යි.

මෙලෙස පරිභෝජනය සඳහා යොදන සේවක වැටුප් සහ ව්‍යවසායකයින් ආයෝජන සඳහා යොදන ලාභය සමාන ලෙස සලකා සංසන්දනය කිරීම නොමග යවන සුළු ක්‍රියාවකි.

ව්‍යවසායකයින්ගේ ලාභ නැවත ආයෝජනය වීමෙන් සිදු වන්නේ සමාජයීය ධනය වර්ධනය වීම යි. නිෂ්පාදන කටයුතු තවත් පුළුල් වීම යි. එමගින් ශ්‍රමය සඳහා වන ඉල්ලුම ඉහළ යෑම නිසා පහළ පන්තියේ ආදායම් ද වැඩි වෙයි.

මෙයට හොඳ ම උදාහරණය වර්තමාන චීනය යි. 1979 දී වෙළෙඳපොළ ආර්ථිකයකට පිවිසීමේ සිට මේ දක්වා එරට ආදායම් විෂමතාවය විශාල ලෙස වැඩි වී ඇත. එය අද ආදායම් විෂමතාවය වැඩි ම රටවල් අතරින් එකකි. නමුත් එම කාලය තුළ චීන ජනයාගේ දරිද්‍රතාවය සියයට පනහක මට්ටමේ සිට සියයට එක දක්වා පහත වැටී ඇත. එහි තේරුම සාමාන්‍ය ජනයාගේ ජීවන තත්ත්වය විශාල ලෙස ඉහළ ගොස් ඇති බව යි.

ඉන්දියාවේ අද සිදුවන ආර්ථික සංවර්ධනය තුළ ද මෙම තත්ත්වය දැකගත හැකි ය. වෙනත් බොහෝ රටවල ද අත්දැකීම් ඒ හා සමාන ය.

මෙයින් පෙනී යන්නේ ධනවතුන් වඩා ධනවත් වන්නේ දුප්පතුන් දුප්පත් කරමින් නොව දුප්පතුන්ගේ ආර්ථිකය ද ශක්තිමත් කරමින් බව යි. එනම් සමාජයක් ලෙස ම ආර්ථික වර්ධනයක් ඇති කරමින් බව යි.

එබැවින් මෙම ආර්ථික විෂමතා අවම කිරීමට ක්‍රියා කළ යුතු වන්නේ සිදුවන ආර්ථික සංවර්ධනයට බාධා නොවන අයුරින් බව තේරුම් ගත යුතු ය. එසේ නොමැතිව විෂමතා නැති කිරීමට යාමෙන් දුප්පත් ජනයාගේ පීඩා තව දුරටත් සමහන් නොවී පැවතීමට හෝ වර්ධනය වීමට හෝ ඉඩ ඇත.

## ධනපතියන් අත මුදල් නැත. ධනය සමාජයීය වේ.

ධනපතියන් අත ඔවුන්ට අවශ්‍ය තරම් මුදල් ඇති බව ඇත්තකි. නමුත් ධනපතියන්ගේ ධනය යනු මුදල් ය යන සාමාන්‍ය විශ්වාසය වැරදි ය. ඔවුන්ගේ වත්කම් ලෙස ගණනය කරන සංඛ්‍යා තුළ ඇත්තේ ඔවුන්ගේ ධනවත් බව පිළිබඳ මිම්මකි. ඒවා මුදල් නොවේ. මෙය තේරුම් ගැනීම වැදගත් වන්නේ ධනපතියන් අත ඇති මුදල් ගෙන බෙදා දී ජනතාවගේ ජීවන මට්ටම් වර්ධනය කළ හැකි බවට ද මිථ්‍යා මතයක් පවතින හෙයිනි.

අප තේරුම් ගත යුතු වන්නේ මුදල් සහ ධනය යනු එකක් නොව දෙකක් බව යි.

මුදල් යනු වෙනත් භාණ්ඩ මෙන් ම හුවමාරු වෙළෙඳ භාණ්ඩයකි. එය විශේෂ ගුණයකින් යුතු භාණ්ඩයකි. එම භාණ්ඩයේ ගුණය වන්නේ වෙනත් භාණ්ඩයක වටිනාකම එමගින් මැනිය හැකි වීම යි. මාක්ස්වාදීන් ලෙස පෙනී සිටින අයට ප්‍රාග්ධනය කෘතියේ පළමු වෙළුමේ තුන්වන පරිච්ඡේදය පමණක් කියවීමෙන් වුව ද එම කරුණ තේරුම් ගත හැකි වනු ඇත.

ධනය ද මුදල් ලෙස පැවතිය හැකි නමුත් එය මුදල් නොවේ. නිෂ්පාදන ක්‍රියාවලියට මුදල් යෙදූ පසු ඒවා පවතින්නේ වෙනත් ස්වරූපවලිනි. එනම්, කර්මාන්තශාලා යන්ත්‍ර සූත්‍ර, අමුද්‍රව්‍ය, සංවිධානය ඇතුළු වෙනත් ස්වරූපවලින් එය පවතියි.

එලෙස ගොඩනැගෙන නිෂ්පාදන ආයතන පවතින්නේ සමාජයීය ආයතන වශයෙනි. සමාජයීය කාර්යයක් ඉටුකරන එය සාමූහික ක්‍රියාකාරීත්වයකි. එහි අයිතිකරුට හෝ කොටස් හිමියන්ට හෝ ඇත්තේ එම ආයතන මෙහෙයවීමේ සමාජයීය බලයකි. පෞද්ගලික දේපළ අයිතිය කියා කියන්නේ එබඳු සමාජයීය බලයකට ය. ධනය ලෙස ගණන් බලන්නේ එම සමාජයීය බලයේ ප්‍රමාණය යි.

උදාහරණයක් ලෙස ලෝක ධනපතියන් පිළිබඳ බ්ලූම්බර්ග් දර්ශකයට අනුව ඇමසන් සමාගමේ අධිපති ජෙෆ් බෙසොගේ වත්කම නැතහොත් ධනය මේ වන විට ඩොලර් බිලියන 198 කි. එයින් කියන්නේ එපමණ මුදලක් ඔහු සතුව ඇති බව නොවේ. ඇමසන් සහ වෙනත් සමාගම්වල ඔහුගේ කොටස්වල වටිනාකමේ එකතුව ඩොලර් බිලියන 198 ක් බව යි.

බෙසොට එම මුදල් ලබා ගැනීමට අවශ්‍ය නම් ඔහු තම කොටස් විකුණා දැමිය යුතු ය. එවිට එම සමාගම් කෙරෙහි ඔහුගේ සමාජයීය බලය අහිමි වෙයි. එය හිමි වන්නේ කොටස් මිල දී ගත් ධනපතියාට හෝ ධනපතියන්ට ය.

මෙලෙස ධනය පවතින්නේ සමාජයීය දේපළ ලෙස නිසා එම ධනය මුදල් කර දිළිඳු ජනයාට හෝ දිළිඳු රටවලට හෝ ලබාදීමේ හැකියාවක් නැත. එක් අයෙකුගේ මුදල් ඉවත්කර ගැනීමට නම් තවත් කෙනෙකු මුදල් යෙදිය යුතු වෙයි. එම දේපළ මුදල් බවට පරිවර්තනය කිරීමේ හැකියාවක් නැත.

ධනපතියන් අත මුදල් නැති බව අප කියන්නේ එම අර්ථයෙනි.

ධනපතියන්ගේ ධනය සමාජයීය බව අප කියන විට නම් තමන් වාමාංශික යැයි සිතා සිටින සහ විද්‍යාත්මක චින්තනයක් ගැන කතා කරන උදවිය උරණ වන්නට ඉඩ ඇත. ධනපතියන්ට කඩේ යන බව ඔවුන් අප ගැන කියන්නට ඉඩ තිබේ. එයට කලබල නොවී ඔවුන් මෙය ද කියවන්නේ නම් යහපත් ය.

***ධනපතියෙකු වීමට නිෂ්පාදනයෙහි හුදෙක් පෞද්ගලික තත්වයක් පමණක් නොව, සමාජයීය තත්වයක් ද අවශ්‍ය වේ. ප්‍රාග්ධනය සාමූහික ඵලයකි. එය නිර්මාණය කොට ක්‍රියා කරවිය හැක්කේ සමාජයේ සාමාජිකයන් බොහෝ දෙනෙකුගේ ක්‍රියාකාරීත්වය තුළින් පමණකි. එපමණක් නොව, අවසානයේ දී සමාජයේ සාමාජිකයන්ගේ එක්සත් ක්‍රියාකාරීත්වය තුළින් පමණකි.***

***එබැවින් ප්‍රාග්ධනය පෞද්ගලික නොව සමාජ බලයකි.***

***(මාක්ස් සහ එංගල්ස් - කොමියුනිස්ට් ප්‍රකාශනය)***

(උපුටාගැනීම: මාක්ස්වාදීන්ගේ අන්තරජාල ලේඛනාගාරය - කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය, 13 පිටුව)

තමන් මාක්ස්වාදීන් ලෙස පෙනී සිටිමින් මාක්ස්ගේ සහ එංගල්ස්ගේ මෙම අදහස්වලට සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ අදහස් ප්‍රකාශ කරන උදවිය හැඳින්විය හැක්කේ 'මිථ්‍යාදෘෂ්ටික මාක්ස්වාදීන්' වශයෙනි. ඔවුන් ක්‍රියා කරන්නේ සමාජ සංවර්ධනයට හරස් වන ප්‍රතිගාමී පිරිසක් වශයෙනි.

ආර්ථික සංවර්ධනය සාර්ථක කරගත හැක්කේ පවතින තත්ත්වයන් පිළිබඳ යථාර්ථවාදී ලෙස කරන විග්‍රහයක් මත පදනම් වෙමින් ක්‍රියා කිරීම මගිනි. එබැවින් ඉහත කී මිථ්‍යා විශ්වාස බැහැර කිරීම අත්‍යවශ්‍ය වෙයි.

## සමස්ත ජනතාවගේ සංවර්ධනය

ආර්ථික සංවර්ධනය රජයේ කාර්යයක් බව සමහරුන් සිතන බව පෙනෙන්නට තිබේ. නමුත් එය එසේ නොවේ. ආර්ථිකය සංවර්ධනය කිරීම ජනතාවගේ කාර්යයකි. ඔවුන් එය කරන්නේ තම තමන්ගේ ආර්ථික සංවර්ධනය ඇතිකර ගැනීම මගිනි. රජය කළ යුත්තේ සහ රජයට කළ හැක්කේ එයට පහසුකම් සැලසීම සහ ඇතැම් අංශ සැලසුම් කිරීම යි.

ඇතැම් විට වැඩි අවධානය යොමු වන්නේ විශාල කර්මාන්ත, ව්‍යාපාර ආදිය කෙරෙහි ය. ඒවා වර්ධනය වීම අවශ්‍ය ය. එමෙන් ම, ගොවියා, ධීවරයා, කම්කරුවා, සුළු කාර්මිකයා, සුළු වෙළෙන්දා ඇතුළු සමස්ත ජනතවගේ ම

සංවර්ධනය අවශ්‍ය ය. එම සංවර්ධනය ඉලක්ක කොට රජය තම සැලසුම් සකස් කොට ක්‍රියාවට නැගිය යුතු ය. එය කුඩා තැන්වල සිට ක්‍රියාත්මක කළ හැකිය. කළ යුතු ය. ඒ සඳහා බොහෝ විට අවශ්‍ය වන්නේ ප්‍රායෝගිකවාදී ක්‍රියාකාරීත්වයකි.

ආර්ථිකය බිඳ වැටී මහජනයා අන්ත අසරණ තත්ත්වයට වැටී සිටි 2022 මැද ජනාධිපති ලෙස වගකීම භාරගත් රනිල් වික්‍රමසිංහ මහතා මුල් කාලයේ ම කළ ක්‍රියාවක් නම් දළදා පෙරහැර ඇතුළු විවිධ පෙරහැර සහ ආගමික උත්සව දිරිමත් කොට ඒවාට පහසුකම් සපයා දීම යි.

මෙම පෙරහැර යනු විශාල ශිල්පීන් පිරිසකගේ, සේවක පිරිසකගේ ආර්ථික ක්‍රියාකාරීත්වයකි. ඔවුන්ගේ ආර්ථිකයට එයින් ශක්තියක් ලැබේ. එමෙන් ම වඩේ, කඩල, අයිස් ක්‍රීම්, ආදී වෙළෙඳ ප්‍රජාවකට ද එය අවස්ථාවකි. ආපන ශාලා, බේකරි සඳහා ද අලෙවිය වැඩි කර ගැනීමේ අවස්ථාවකි. ත්‍රී වීල්, බස් ඇතුළු ප්‍රවාහන සේවා ද යම් වර්ධනයක් සිදුවෙයි. එලෙස ආර්ථිකයේ කුඩා හෝ වර්ධනයකට එය අවස්ථාව වෙයි. එබඳු අවස්ථා දිරිමත් කොට වර්ධනය කිරීම අවශ්‍ය වෙයි.

සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට රජය විශාල බරක් දමා ක්‍රියාත්මක වන බව පෙනෙන්නට තිබේ. එය ද ලක්ෂ ගණනක් ජනයාගේ ආර්ථික වර්ධනයට දිරි දීමකි. එම ක්ෂේත්‍රයේ වර්ධනය ආර්ථිකයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙනු ඇත.

පොහොර සහනාධාර දෙමින් සහ තවත් දිරි ගැන්වීම් මගින් කෘෂි නිෂ්පාදනය ද ඉහළ දමාගෙන ඇත. කෙසේ වෙතත්, ගොවියාගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට නම් නව තාක්ෂණය වෙත යොමුවීම, අපනයන කෘෂිකර්මය වර්ධනය ආදී තවත් බොහෝ දේ කළ යුතු වෙයි.

මාර්ග සංවර්ධනය වැනි කටයුතු පසුගිය කාලයේ නවතා තිබිණි. ආර්ථික තත්ත්වය යහපත් වීමත් සමග පසුගිය දා එම කටයුතු යළි ආරම්භ කරනු ලැබී ය. එය ද ගමේ ජනයාගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ පියවරකි. රජයේ උත්සාහය වී ඇත්තේ නැවතී තිබූ මධ්‍යම අධිවේගී මාර්ගය වැනි ව්‍යාපෘති ද ඉක්මනින් ආරම්භ කිරීම ය.

අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ පළමු වටය මගින් දිළිඳු පවුල් ලක්ෂ 17 කගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. රජයේ සැලසුම එය ලක්ෂ 24 දක්වා වැඩි කිරීමට ය. එම දෙවැනි අදියර දැන් ක්‍රියාත්මක ය. රාජ්‍ය සේවක

වැටුප රුපියල් 10,000 කින් වැඩි කළේ අති විශාල සහ ආකාර්යක්ෂම රාජ්‍ය සේවය ගැන විවේචන තිබිය දී ය. එය ලැබෙන සංඛ්‍යාව ලක්ෂ 16 කි.

අස්වැසුම සහ රජයේ සේවක වැටුප් වැඩිවීමේ ආර්ථික වාසිය හිමිවන්නේ එම පවුල්වලට පමණක් නොවේ. ඔවුන් මෙම මුදල් යොදාගෙන තම පරිභෝජනය වැඩි කරන විට වෙළෙඳ ප්‍රජාව, ගොවියා, ධීවරයා දක්වා විශාල පිරිසකගේ ආර්ථිකයට එය ශක්තියක් වෙයි.

රජයේ සේවකයෙකු තමන්ට වැඩිපුර ලැබුණු මුදලින් වෙනදාට වඩා එළවළු මිල දී ගත හොත්, එළවළු වෙළෙන්දා, තොග වෙළෙන්දා, ප්‍රවාහනකරුවා සහ එළවළු ගොවියාට ද ප්‍රතිලාභ හිමි වෙයි. වැඩිපුර මාළු මිල දී ගතහොත් මාළු වෙළෙන්දාගේ සිට ධීවර කාර්මිකයා දක්වා ප්‍රතිලාභ අත්වෙයි. එක ම මුදලින් ගනුදෙනු ගණනාවක් සිදුවෙයි.

මෙලෙස අර්බුද අවස්ථාවක එයට විසඳුම් ලෙස ජනතාව අතට මුදල් යැවීමේ අදහස ජෝන් මේනාඩ් කේන්ස් නම් ආර්ථික විද්‍යාඥයාගේ ය. එක ම මුදලින් ගනුදෙනු ගණනාවක් සිදුවීම ඔහු හැඳින්වූයේ බහු ගුණ වීමේ බලපෑම (Multiplying Effect) වශයෙනි.

නව ලිබරල් ලේබලය අලවමින් සියලු දේ ප්‍රතික්ෂේප කරන්නට හදන උදවියට කිව යුත්තේ මෙය නම් නව ලිබරල්වාදය නොව ඊට ප්‍රතිවිරුද්ධ දර්ශනය වන කේන්ස්වාදය බව යි. එය අප මේ මොහොතේ භාවිතා කළ යුත්තේ ප්‍රායෝගිකවාදයක් වශයෙනි.

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා ද ව්‍යාපෘති ගණනාවක් බැංකු හරහා ක්‍රියාත්මක කරන බව කියති. ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 100 ක ආධාරයක් ලැබුණු බව ද වාර්තා වී ය. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන්ම අලුතින් සංවර්ධන බැංකුවක් ආරම්භ කිරීමට රජය රු. බිලියන 50ක් වෙන් කර ඇති අතර එය රු. බිලියන 100ක් දක්වා වැඩි කිරීමට ද සැලසුම් කර තිබේ.

බැංකු පොලී අඩු කිරීම සහ උද්ධමනය පාලනය කිරීම ද ව්‍යාපාර ශක්තිමත් කොට ආර්ථිකයේ ප්‍රගතියක් ඇති කිරීමට හේතු වන බව විශ්වාස කෙරෙයි.

මේ වනාහි රජය කළ සහ කරන බව කියන වැඩ සටහන් අතර කිහිපයකි. තවත් බොහෝ වැඩ සටහන් තිබිය හැකි ය. ඒවා ප්‍රමාණවත් ද, සාර්ථක වේ ද ආදී කරුණු සංවාදයට ලක්විය යුතු ය.

කෙසේ වෙතත්, මතක තබා ගත යුතු කරුණ නම් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම යනු රටේ සමස්ත ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමක් විය යුතු බව යි. එහි දී සමාජයේ එක් එක් පුද්ගලයා දක්වා සියලු දෙනාගේ ආර්ථිකය වර්ධනය විය යුතු ය. සෑම දෙනාට ම එයට අවස්ථාව සලසමින් එයට පහසුකම් සැපයීම රජයේ වගකීම යි.

"තමන් මාක්ස්වාදීන් ලෙස පෙනී සිටිමින් මාක්ස්ගේ සහ එංගල්ස්ගේ මෙම අදහස්වලට සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ අදහස් ප්‍රකාශ කරන උදවිය හැඳින්විය හැක්කේ 'මිථ්‍යාදෘෂ්ටික මාක්ස්වාදීන්' වශයෙනි. ඔවුන් ක්‍රියා කරන්නේ සමාජ සංවර්ධනයට හරස් වන ප්‍රතිගාමී පිරිසක් වශයෙනි. ආර්ථික සංවර්ධනය සාර්ථක කරගත හැක්කේ පවතින තත්ත්වයන් පිළිබඳ යථාර්ථවාදී ලෙස කරන විග්‍රහයක් මත පදනම් වෙමින් ක්‍රියා කිරීම මගිනි. එබැවින් ඉහත කී මිථ්‍යා විශ්වාස බැහැර කිරීම අත්‍යවශ්‍ය වෙයි."

- සී.ජේ. අමරතුංග

අලුත් කතාබහ
ආණ්ඩු පෙරලියක් වෙනුවට, සමාජ පෙරලියක්!

සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය
சமூக நீதிக்கான தேசிய இயக்கம்
NATIONAL MOVEMENT FOR SOCIAL JUSTICE

නිදහසේ වේදිකාව
சுதந்திரத்திற்கான அரங்கம்
Platform for FREEDOM
www.platformforfreedom.org

WOMEN'S POLITICAL ACADEMY

ISBN 978-624-5860-06-7

9 786245 860067

**We Have a Dream සාමූහිකය**
අංක 56/2, පාලිත පෙදෙස, කොළඹ 9.
දුරකථන: +94 112 669100